WWW.ALEVELAPI.COM

සාමාන්‍ය තොරතුරු තාක්ෂණය

(GIT)

ගුරු මාර්ගෝපදේශය

12 ශ්‍රේණිය

(2017 සිට ක්‍රියාත්මක වේ)

තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව

www.nie.lk

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

සාමාන්‍ය තොරතුරු තාක්ෂණය
12 ශ්‍රේණිය - ගුරු මාර්ගෝපදේශය

©ජාතික අධ්‍යාපන ආයතනය
පළමු මුද්‍රණය 2017

ISBN :

තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව
විද්‍යා හා තාක්ෂණ පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

www.nie.lk

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ්‍ය හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

අන්තර්ගතය	පිටු අංකය
1. අධ්‍යක්ෂ **ජනරාල් තුමියගේ පණිවිඩය**	**iv**
2. නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ පණිවිඩය	**v**
3. විෂයමාලා කමිටුව	**vi-vii**
4. හැඳින්වීම	**viii**
5. පොදුජාතික අරමුණු	**ix**
6. මූලික නිපුණතා	**x-xi**
7. විෂය අභිමතාර්ථ	**xii**
8. එක් එක් ඒකකය සඳහා යෝජිත කාලඡේද ගණන	**xiii**
9. විෂය නිර්දේශය	**1-17**
10. ගුරු මාර්ගෝපදේශය	**18 -118**
11. ආශ්‍රිත සබැඳි සහ ග්‍රන්ථ	**119**

AlevelApi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

අධ්‍යක්ෂ ජනරාල් තුමියගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශිත ජාතික අධ්‍යාපන අරමුණු සාක්ෂාත්කර ගැනීම සහ පොදු නිපුණතා සංවර්ධනයකිරීමේ මූලික අරමුණු සහිතව එවකට පැවැතිඅන්තර්ගතය පදනම් වූ විෂයමාලාව නවීකරණයට භාජනය කොට වර්ෂ අටකින් යුතුචක්‍රයකින්සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු වන අදියර, වර්ෂ 2007 දී ජාතික අධ්‍යාපනආයතනය විසින් ශ්‍රීලංකාවේ ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදී.

පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද, අධ්‍යාපනය පිළිබඳ විවිධ පාර්ශව ඉදිරිපත්කළ යෝජනා ද පදනම් කොට ගෙන සිදු කරන විෂයමාලා තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියකප්‍රතිඵලයක් ලෙස විෂයමාලා චක්‍රයේ දෙවැනි අදියර අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දීම 2015වසරේ සිට ආරම්භ කර ඇත.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලූ ම විෂයවල නිපුණතා පදනම් මට්ටමේ සිටඋසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩනැඟීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස්සමෝධාන ක්‍රමය භාවිත කර ඇති අතර විවිධ විෂයවල දී එක ම විෂය කරුණු නැවත නැවතඉදිරිපත් වීම හැකිතාක් අවම කිරීම, විෂය අන්තර්ගතය සීමා කිරීම සහ ක්‍රියාත්මක කළ හැකිශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සමෝධාන ක්‍රමය භාවිත කර ඇත.

ගුරු භවතුන්ට පාඩම් සැලසුම් කිරීම, ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සාර්ථකවනිරත වීම, පන්ති කාමර මිනුම් හා ඇගයීම් ප්‍රයෝජනවත් පරිදි යොදා ගැනීම සඳහා අවශ්‍ය වනමාර්ගෝපදේශ ලබා දීමේ අරමුණින් නව ගුරු මාර්ගෝපදේශ හඳුන්වා දී ඇත. පන්ති කාමරයතුළ දී වඩාත් ඵලදායී ගුරුවරයකු ලෙස කටයුතු කිරීමට මෙම ගුරු මාර්ගෝපදේශ උපකාර වනුඇත. සිසුන්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරාගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමඟින් ලබා දී තිබේ. ඒ මෙන්ම නිර්දේශිත පාඨග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවලඅන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපනප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමඟ සමගාමී ව භාවිත කිරීමඅත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා නව පාඨ ග්‍රන්ථවලමූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යපන රටාවෙන් මිදී සිසු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවකටහා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට එළඹීම මඟින් වැඩ ලෝකයටඅවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවලින් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාවසංවර්ධනය කිරීම යි.

නව විෂය නිර්දේශ සහ ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපනආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ ද, ආයතන සභාවේ ද, රචනයේ දී දායකත්වය ලබාදුන් සියලූ ම සම්පත්දායකයින් හා වෙනත් පාර්ශවවල ද ඉමහත් කැපවීම ඇගයීමට ද මෙයඅවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

ආචාර්යජයන්තිගුණසේකර
අධ්‍යක්ෂජනරාල්
ජාතිකඅධ්‍යාපනආයතනය

AlevelApi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ පණිවිඩය

අතීතයේ සිට ම අධ්‍යාපනය නිරන්තරයෙන් වෙනස් වීම්වලට භාජනය වෙමින් ඉදිරියට ගමන් කරමින් තිබුණි. මෑත යුගයේ මෙම වෙනස් වීම දැඩි ලෙස ශීඝ්‍ර වී ඇත. ඉගෙනුම් ක්‍රමවේදවල මෙන් ම තාක්ෂණික මෙවලම් භාවිතය අතින් හා දැනුම උත්පාදනය සම්බන්ධයෙන් ද ගත වූ දශක දෙක තුළ විශාල පිබිදීමක් දක්නට ලැබුණි. මේ අනුව ජාතික අධ්‍යාපන ආයතනය ද 2015 ට අදාළ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සඳහා අප්‍රමාද ව සුදුසු පියවර ගනිමින් සිටී. ගෝලීය ව සිදු වන වෙනස්කම් ගැන හොඳින් අධ්‍යයනය කර දේශීය අවශ්‍යතා අනුව අනුවර්තනයට ලක් කර ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම්-ඉගැන්වීම් ප්‍රවේශය පාදක කර ගනිමින් නව විෂයමාලාව සැලසුම් කර පාසල් පද්ධතියේ නියමුවන් ලෙස සේවය කරන ගුරු භවතුන් වන ඔබ වෙත මෙම ගුරු මාර්ගෝපදේශය පුද කරන්නේ ඉතා සතුටිනි.

මෙවැනි නව මග පෙන්වීමේ උපදේශන සංග්‍රහයක් ඔබ වෙත ලබා දෙන්නේ ඒ මඟින් ඔබට වඩා හොඳ දායකත්වයක් ලබා දිය හැකිවේය යන විශ්වාසය නිසා ය.

මෙම උපදේශන සංග්‍රහය පන්ති කාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ඔබට මහඟු අත්වැලක් වනවාට කිසිම සැකයක් නැත. එසේ ම මෙය ද උපයෝගී කර ගනිමින් කාලීන සම්පත් ද්‍රව්‍ය භාවිතයෙන් වඩාත් සංවර්ධනාත්මක ප්‍රවේශයක් ඔස්සේ පන්ති කාමරය හසුරුවා ගැනීමට ඔබට නිදහස ඇත.

ඔබ වෙත ලබා දෙන මෙම ගුරු මාර්ගෝපදේශය මැනවින් අධ්‍යයනය කර වඩා නිර්මාණශීලී දරු පරපුරක් බිහි කර ශ්‍රී ලංකාව ආර්ථික හා සමාජීය අතින් ඉදිරියට ගෙන යාමට කැපවීමෙන් යුතුව කටයුතු කරනු ඇතැයි මම විශ්වාස කරමි.

මෙම ගුරු මාර්ගෝපදේශය නිර්මාණය වුයේ මෙම විෂය ක්ෂේත්‍රයට අදාළ ගුරු භවතුන් හා සම්පත් පුද්ගලයින් රැසකගේ නොපසුබට උත්සාහය හා කැපවීම නිසා ය.

අධ්‍යාපන පද්ධතියේ සංවර්ධනය උදෙසා නිම වූ මෙම කාර්යය මා ඉතාමත් උසස් ලෙස අගය කරන අතර මේ සඳහා කැපවී ක්‍රියා කළ ඔබ සැමට මගේ ගෞරවාන්විත ස්තුතිය පිරිනමමි.

එම්.එෆ්.එස්.පී. ජයවර්ධන
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
(විද්‍යා හා තාක්ෂණ පීඨය)
ජාතික අධ්‍යාපන ආයතනය

AlevelApi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ්‍ය හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

විෂයමාලා කමිටුව

මාර්ගෝපදේශණය සහ අනුමැතිය

අධ්‍යයන කටයුතු මණ්ඩලය
ජාතික අධ්‍යාපන ආයතනය

විෂයය සම්බන්ධීකරණය

එස්.ෂන්මුගලිංගම් මහතා
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
ජාතික අධ්‍යාපන ආයතනය

සම්පත් දායකත්වය

ඩී. අනුර ජයලාල් මහතා

අධ්‍යක්ෂ, තොරතුරු තාක්ෂණ
දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

එස්.ෂන්මුගලිංගම් මහතා

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
ජාතික අධ්‍යාපන ආයතනය

ආචාර්ය දමිත ඩී කරුණාරත්න

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
(පරිගණක පාසල)
කොළඹ විශ්වවිද්‍යාලයය

ආචාර්ය ගාමිණී විජයරත්න

පීඨාධිපති,
පරිගණන සහ තාක්ෂණ පීඨය
කැලණිය විශ්වවිද්‍යාලයය

ආචාර්ය එච්.කේ.ටී.කේ.විජයසිරිවර්ධන

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
කර්මාන්ත පරිපාලන පීඨය
කැලණිය විශ්වවිද්‍යාලයය

ආචාර්ය කේ. තබෝදරන්

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
පරිගණක විද්‍යා පීඨය
යාපනය විශ්වවිද්‍යාලයය

ආචාර්ය පී.එම්.ටී.බී.සන්දිරිගම

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
ඉංජිනේරු පීඨය
පේරාදෙණිය විශ්වවිද්‍යාලයය

එච්.පී. රුක්මලී මිය

සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ
තොරතුරු තාක්ෂණ ඒකකය
අධ්‍යාපන අමාත්‍යංශය

ඩබ්.එම්.ඒ.එස්.විජේසේකර මහතා

මධ්‍යස්ථාන කළමනාකරු
හාලිඇල කලාපීය පරිගණක සම්පත්
මධ්‍යස්ථානය

AlevelApi.com උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

එස්.කේ.එන්.සූරියආරච්චි මහතා	ශ්‍රී ලංකා ගුරු සේවය කඩවත ම.ම.වි.
කේ.පී.එන්.කරුණානායක මහතා	මධ්‍යස්ථාන කළමනාකරු ගලහිටියාව පරිගණක සම්පත් මධ්‍යස්ථානය
ඒ.ඒ.ඩී.සරත් කුමාර මහතා තොරතුරු	දේශක, උතුරු මැද පළාත් තාක්ෂණඅධ්‍යාපනමධ්‍යස්ථානය, අනුරාධපුරය
පී. සිවදර්ශන් මහතා	උපදේශක නැඟෙනහිර විශ්වවිද්‍යාලයය

AlevelApi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

හැඳින්වීම

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය නවීන ලෝකයේසෑම ක්ෂේත්‍රයකටම අනුගතඅනිවාර්ය අංගයක් බවට පත්ව ඇත. අනාගත අභියෝග වලට මුහුණ දීමේ විශ්වාසයක් සහිත පුරවැසියන් බිහි කිරීමේලා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දැනුම අත්‍යවශ්‍ය මෙවලමක් බවට පත්ව ඇත. එබැවින්, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ මූලික දැනුමක් ශිෂ්‍යයන් සතුවිය යුතු ය.වැඩිදුර අධ්‍යාපනයේදී සහ රැකියා සඳහා දිශාභිමුඛ කිරීමේදී යන අවස්ථා දෙකම සඳහා අවශ්‍ය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ මූලික දැනුවත්භාවයක් ලබාදීමතුළින් අභියෝගාත්මක සමාජයකට මුහුණ දිය හැකි අන්දමේ සිසුන් පිරිසක් බිහි කිරීම, මෙම සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විෂය නිර්දේශ සංශෝධනයේ ප්‍රධාන අරමුණයි.

සාමාන්‍ය තොරතුරු තාක්ෂණවිෂයය වර්ෂ **2002** දී ප්‍රථම වරට හඳුන්වා දෙන ලදී. විෂය නිර්දේශ පුනරීක්ෂණ චක්‍රයට අනුව, මෙම පුනරීක්ෂණය වර්ෂ **2005**දී සිදු කරන ලද අතර, වර්ෂ **2017**දී පටන් පාසල්වල **12** ශ්‍රේණියේ සිසුන් සඳහා ක්‍රියාත්මක කිරීමට නියමිතය. මෙම සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විෂයය, අ.පො.ස.(උසස් පෙල) සියලුම විෂය ධාරාවලට අයත් සිසුන් සඳහා පොදු විෂයයකි. මෙම විෂය සඳහා කාලඡේද **60**ක් (පැය **40**ක්) වෙන්කොට ඇති අතර, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් ජාතික මට්ටමේ විභාගයක් **2005** වසරේ සිට වාර්ෂිකව පවත්වනු ලබයි.

AlevelApi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

ජාතික අරමුණු

i. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාවජාතික සෘජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම
ii. වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැගි දායාද හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම
iii. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම
iv. පුද්ගලයින් ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයවලට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම
v. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම
vi. පුද්ගලයා ගේ සහ ජාතියේ ජීව ගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්ය සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම
vii. ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩ ගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම
viii. ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම

ජාතික අධ්‍යාපන කොමිසම් වාර්තාව **(2003)**

AlevelApi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බෝහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කර ගැනීමට දායක වනු ඇත.

i. සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, චිත්‍රක භාවිතය සහ තොරතුරු තාක්ෂණ නිපුණතා යන අනුකාණ්ඩ හතරක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

සාක්ෂරතාව: සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලි ව කතා කිරීම, අවබෝධය සඳහා කියවීම, නිවැරදිව සහ නිරවුල්ව ලිවීම, ඵලදායී අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

සංඛ්‍යා පිළිබඳ දැනුම:භාණ්ඩ, අවකාශය හා කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

චිත්‍රක භාවිතය :රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහවර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

තොරතුරු තාක්ෂණ:ප්‍රවීණත්වය :පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද, සේවා පරිශ්‍රයන් තුළදී ද, පෞද්ගලික ජීවිතයේ දී ද, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම

ii. පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලූ නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැගීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- සෘජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම වැනි අගයයන්
- චිත්තවේගී බුද්ධිය

iii. පරිසරයට අදාළ නිපුණතා

මෙම නිපුණතා සාමාජික, පෙව සහ භෞතික පරිසරවලට අදාළ වේ.

සමාජ පරිසරය: ජාතික උරුම පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැගීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

පෙව පරිසරය: සජීවී ලෝකය, ජනතාව සහ පෙව පද්ධතිය, ගස්වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය, ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

භෞතික පරිසරය:අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍යය, සුව පහසුව, නින්ද, සැහැල්ලු බව, විවේකය, අපද්‍රව්‍ය සහ බහිස්‍රාවය, සන්නිවේදනය සහ

AlevelApi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

ප්‍රවාහන මාධ්‍යයක් ලෙස යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව

ඉගෙනීම වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් භාවිතයේ නිපුණතාද මෙහි අඩංගු වේ.

iv. වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා

- ආර්ථික සංවර්ධනයට දායක වීම
- තම වෘත්තීය ළැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම
- හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

v. ආගම සහ ආචාර ධර්මවලට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවලට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අදාළ අගය උකහා ගැනීම හා ස්වීයකරණය

vi. ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

vii. 'ඉගෙනීමට ඉගෙනුම්' පිළිබඳ නිපුණතා:

ශීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස් වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත්, ස්වාධීන ව ඉගෙන ගැනීමත්, සඳහා පුද්ගලයින් හට ශක්තිය ලබා දීම

AlevelApi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

විෂය අභිමතාර්ථ

මෙම විෂය නිර්දේශය මඟින් **12** ශ්‍රේණියේ සිසුන්ට පහත දැක්වෙන කුසලතා ලබා දේ:

- පහත දැක්වෙන ආකාරයට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ යෙදීම් හා උපක්‍රම හඳුනාගෙන එදිනෙදා ජීවිතයේ දී භාවිත කරයි
    - පරිගණකයක අභ්‍යන්තර ක්‍රියාකාරීත්වය අවබෝධ කරගැනීම
    - එදිනෙදා විවිධ කටයුතු සඳහා සුදුසු වන යෙදවුම් මෘදුකාංග භාවිතය
    - සමාජය සමඟ ගනුදෙනු කිරීම සඳහා ඵලදායී ලෙස, කාර්යක්ෂම ලෙස හා සදාචාරාත්මක ලෙස පරිගණක භාවිත කිරීම
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයට සම්බන්ධ විවිධ රැකියා අවස්ථා පිළිබඳ ගවේෂණය

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

එක් එක් ඒකකය සඳහා යෝජිත කාලච්ඡේද ගණන

වාරය	නිපුණතා මට්ටම	කාලච්ඡේද ගණන
පළමු වන වාරය	1.1, 1.2 2.1, 2.2, 2.3 3.1, 3.2 4.1	03 04 03 06 (කාලච්ඡේද16)
දෙවන වාරය	4.2, 43, 4.4 5.1, 5.2, 5.3	16 07 (කාලඡේද23)
තුන් වන වාරය	6.1, 6.2 7.1, 7.2, 7.3, 7.4 8.1, 8.2, 8.3	05 10 06 (කාලච්ඡේද21)

AlevelApi.com උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

නිපුණතාව	නිපුණතා මට්ටම	විෂය අන්තර්ගතය	ඉගෙනුම් පල	කාලච්ඡේද
නිපුණතාවය 01 කාලීන ප්‍රතිලාභ නෙළා ගැනීමට පරිගණකය සහ එහි විභවය ගවේෂණය කරයි	**1.1** පරිගණකයේ තැනුම් ඒකක රූප සටහන ඇසුරින්, පරිගණක පද්ධතිය විස්තර කරයි	• පද්ධති සංකල්පය • පරිගණකය හැඳින්වීම • පරිගණකයේ සංරචක ○ දෘඩාංග ▪ ආදාන /ප්‍රතිදාන උපක්‍රම් ▪ මතක උපක්‍රම ▪ ආචයන උපක්‍රම (ප්‍රකාශ, චුම්බක හා අර්ධ සන්නායක) ▪ සකසනය ○ මෘදුකාංග ▪ පද්ධති මෘදුකාංග (මෙහෙයුම් පද්ධතිය, උපයෝගිතා මෘදුකාංග) ▪ යෙදුම් මෘදුකාංග • පරිගණකයේ තැනුම් ඒකක රූසටහන **(Block Diagramof a Computer)** ○ ආදාන ○ සැකසුම් ඒකකය(**ALU, CU)** ○ ප්‍රතිදාන ○ මතක/ආචයන ○ පරිගණකයේ උපාංග අතර දත්ත සහ මෙහෙයුම් විධාන ගලායාම • දත්ත සහ තොරතුරු • ගුණාත්මක තොරතුරුවල ගතිලක්ෂණ	• පද්ධතියක් යන්න නිර්වචනය කරයි • පරිගණකයක් පද්ධතියක් ලෙස හඳුනාගනී **(IPO)** • පරිගණකයක් පද්ධතියක සංරචකයක් ලෙස හඳුනාගනී • පරිගණකයක දෘඩාංග ලැයිස්තු ගතකර සංක්ෂිප්තව පැහැදිලි කරයි • පර්යන්ත උපාංග**(Peripherals)** සහ අනෙකුත් ආදාන/ ප්‍රතිදාන උපාංග වෙන්කොට හඳුනා ගනී • පරිගණක මෘදුකාංග ලැයිස්තු ගත කර සංක්ෂිප්ත ව පැහැදිලි කරයි • පරිගණකයේ තැනුම් ඒකක රූ සටහන ඇඳ, එහි එක් එක් සංරචකය නම් කරයි • පරිගණකයේ සංරචක කෙටියෙන් විස්තර කරයි • දත්ත සහ තොරතුරු උදාහරණ සහිත ව වෙන් කොට හඳුනා ගනී • ගුණාත්මක තොරතුරුවල ගතිලක්ෂණ නම් කොට කෙටියෙන් විස්තර කරයි	**02**
	1.2පුද්ගල පරිගණකවල දෘඩාංග පිරිවිතර හඳුනා ගනී	• පුද්ගල පරිගණක දෘඩාංග පිරිවිතර ○ සකසනය ○ මතකය ○ දෘඩ තැටිය ○ මවු පුවරුව ○ කෙවෙනි ○ **Chip set** ○ තිරය/මොනිටරය	• අවශ්‍යතාවට අදාළ සහ මූල්‍යමය හැකියාවට අනුව සුදුසු පුද්ගල පරිගණක පිරිවිතර හඳුනාගෙන,තෝරා ගනී • පරිගණකයක සහ උපාංගවල පිරිවිතර සකස් කරයි • පරිශීලකයාගේ අවශ්‍යතාවට අදාළ ව මෘදුකාංග තෝරාගනී	**01**

නිපුණතාව	නිපුණතා මට්ටම	විෂය අන්තර්ගතය	ඉගෙනුම් පල	කාලච්ඡේද
		○ චිත්‍රක සැකසුම් ඒකකය **(Graphic Processing Unit)** • පුද්ගල පරිගණක සඳහා මෘදුකාංග පිරිවිතර ○ මෙහෙයුම් පද්ධතිය ○ යෙදුම් මෘදුකාංග ○ උපයෝගිතා මෘදුකාංග		
නිපුණතාව 02 පරිගණකය තුළ දත්ත නිරූපණය වන ආකාරය ගවේෂණය කරයි	**2.1** පරිගණකය තුළ දත්ත නිරූපණය වන ආකාරය පිළිබඳ මූලික සංකල්ප විස්තර කරයි	• සංඛ්‍යා පද්ධති ○ දශමය ○ ද්විම ෂඩ් ○ දශමය • පරිවර්තනය සඳහා අදාළ ක්‍රමවේද (ධන පූර්ණ සංඛ්‍යා පමණකි) ○ දශම සංඛ්‍යා ද්විමය සංඛ්‍යාවලට ○ ද්විම සංඛ්‍යා දශම සංඛ්‍යාවලට	• ස්ථානීය අගය, මුහුණත් අගය හා වටිනාකම් යන කරුණු පදනම් කොට ගෙන සංඛ්‍යා පද්ධති විස්තර කරයි • පරිගණකය තුළ සංඛ්‍යා පද්ධතිවල භාවිතය හඳුනා ගනී • දශම සංඛ්‍යා ද්විම් බවට පරිවර්තනය කරයි • ද්විම් සංඛ්‍යා දශම බවට පරිවර්තනය කරයි	**02**
	2.2 මූලික බූලියානු කාරක හඳුනාගනියි	• මූලික බූලියානු කාරක ○ **AND** ○ **OR** ○ **NOT**	• මූලික බූලියානු කාරක සඳහා සත්‍යතා වගු අඳියි • දෙන ලද බූලියානු ප්‍රකාශන සඳහා සත්‍යතා වගු අඳියි	**01**
	2.3 විවිධ අනුලක්ෂණ නිරූපණය සහ ඒවායේ භාවිත විස්තර කරයි	• පරිගණකය තුළ භාවිත වන කේතන ක්‍රම ○ ඇස්කි**(ASCII)** ○ යුනිකේත**(Unicode)**	• පරිගණකයක කේතන ක්‍රමවල අවශ්‍යතාව කෙටියෙන් විස්තර කරයි • ඇස්කි සහ යුනිකේතන පද්ධති සසඳා විස්තර කරයි	**01**

නිපුණතාව	නිපුණතා මට්ටම	විෂය අන්තර්ගතය	ඉගෙනුම් පල	කාලච්ඡේද
නිපුණතාව 03 : මෙහෙයුම් පද්ධති පිළිබඳ ව අවබෝධය මඟින් පරිගණකය කාර්යක්ෂම හා ඵලදායී අයුරින් භාවිත කරයි	**3.1** පරිගණකයේ ක්‍රියාකාරිත්වය උදෙසා මෙහෙයුම් පද්ධතියක දායකත්වය විමර්ශණය කරයි	• මෙහෙයුම් පද්ධති හැඳින්වීම • මෙහෙයුම් පද්ධතියේ මූලික කර්තව්‍ය	• පරිගණක තුළ මෙහෙයුම් පද්ධතියේ භාවිතය කෙටියෙන් පැහැදිලි කරයි • මෙහෙයුම් පද්ධතියක කාර්යයන් ලැයිස්තුගත කරයි • මෙහෙයුම් පද්ධති මඟින් ලබා දෙන අතුරු මුහුණත් වර්ග දෙක වෙන් කොට හඳුනා ගනී -විධාන රේඛා අතුරුමුහුණත(CLI) සහ චිත්‍රක පරිශීලක අතුරුමුහුණත(GUI)	
	3.2 මෙහෙයුම් පද්ධතිවල කාර්යයන් භාවිත කරයි	• ගොනු සහ ගොනු බහලු කළමනාකරණය (නිර්මාණය, නම් කිරීම, මැකීම, නම් වෙනස් කිරීම,කොපි කිරීම හා විතැන් කිරීම) • ගොනු නාම සහ දිගු • පාලන මඩුල්ල(Control panel) තුළ සකස් කිරීම් ○ උපස්ථ කිරීම ○ අක්ෂර ○ දිනය හා වේලාව සහ ප්‍රාදේශීය භාෂා සකස් කිරීම ○ මූසිකයේ සකස් කිරීම් ○ වැඩසටහන් එකතු කිරීම හා ඉවත් කිරීම ○ පරිශීලක ගිණුම් • මෙහෙයුම් පද්ධතියට අයත් මෙවලම් ○ අනුලක්ෂණ සිතියම (Character map) ○ තැටි ප්‍රතිඛණ්ඩනය ○ තැටි පරීක්ෂා කිරීම ○ තැටි පිරිසිදු කිරීම	• සුදුසු නමක් සහිත ව ගොනු සහ ගොනු බහලු නිර්මාණය කරයි • ගොනුවල දිගු අනුව, ගොනු වර්ග වෙන් කොට හඳුනා ගනී • පවතින ගොනු සහ ගොනු බහලු සඳහා පහත මෙහෙයුම් ආදර්ශනය කරයි ○ නම් වෙනස් කිරීම ○ කොපි කිරීම සහ විතැන් කිරීම ○ මැකීම • පාලන මඩුල්ලේ පිහිටුවීම් (Control panelsettings) අවශ්‍ය පරිදි සකස් කරයි • අදාළ කාර්යයන් ඉටු කිරීම සඳහා, මෙහෙයුම් පද්ධතියට අයත් මෙවලම් කිහිපයක් සුදුසු පරිදි යොදා ගනී	**02**

නිපුණතාව	නිපුණතා මට්ටම	විෂය අන්තර්ගතය	ඉගෙනුම් පල	කාලච්ඡේද
04. විදිනෙදා ජීවිතයේ කාර්යයන් සඳහා යෙදුම් මෘදුකාංග යොදාගනී	**4.1**විදිනෙදා කාර්යයන් සඳහා වදන් සැකසුම් මෘදුකාංග භාවිත කරයි	• වදන් සැකසුම් මෘදුකාංග හැඳින්වීම • වදන් සැකසුම් මෘදුකාංගවල ලක්ෂණ • වදන් සැකසුම් මෘදුකාංගයක චිත්‍රක පරිශීලක අතුරුමුහුණතේ සංරචක ○ මාතෘකා තීරුව(Title bar) ○ හැඩසව් මෙවලම් (Formatting tools) ○ සංස්කරණ මෙවලම් (Editing tools) ○ පිටු සැකසුම් මෙවලම් (Page Setup Tools) ○ පිරිසැලසුම් මෙවලම්(Design tools) ○ අනුචලන තීරු (Scroll Bars) ○ දසුන් මෙවලම්(View tools) ○ වගු මෙවලම්(Table tools) ○ සංස්කරණ පෙදෙස(Editingarea) ○ නිවේශන ලක්ෂ්‍යය සහ කර්සරය(insertion point and Cursor) • තත්ත්ව තීරුව(Status Bar) • නව ලේඛනයක් නිර්මාණය කිරීම ○ පිටු වින්‍යාසය හා මායිම් සකස් කිරීම ○ නව ලේඛනයක් යතුරුලියනය කිරීම ○ ලේඛනයක ස්වභාවය වෙනස් කිරීම(Formatting) ○ ශීර්ෂක/පාදක(Header/Footer) • ලේඛනයක් සංස්කරණය කිරීම ○ සෙවීම හා විස්තාපනය කිරීම ○ ව්‍යාකරණ හා අක්ෂර වින්‍යාසය පරීක්ෂා කිරීම ○ කපා දැමීම, කොපිකිරීම හා ඇලවීම • ලේඛනයක් මතට විවිධ වස්තු ඇතුළත් කිරීමහා ඒවාට අදාළ මෙවලම් භාවිතය ○ පින්තූර,ප්‍රස්තාර,හැඩතල,පසරු	• වදන් සැකසුම් මෘදුකාංග කෙටියෙන් පැහැදිලි කරයි • වදන් සැකසුම් මෘදුකාංගවල භාවිතය කෙටියෙන් පැහැදිලි කරයි • වදන් සැකසුම් මෘදුකාංගවල ලක්ෂණ සාකච්ඡා කරයි • වදන් සැකසුම් මෘදුකාංගයක චිත්‍රක පරිශීලක අතුරුමුහුණතේ සංරචක ලැයිස්තු ගත කරයි • නව ලේඛනයක් නිර්මාණය කරයි • නිවැරදි පාඨ ආකාර යොදා ගනී • ඡේද හැඩසව් කරණය භාවිත කරයි • අවශ්‍ය විටක දීලේඛනයක් සංස්කරණය කිරීමට සංස්කරණමෙවලම් යොදා ගනී • ව්‍යාකරණ හා අක්ෂර වින්‍යාස මෙවලම් භාවිත කරයි • අදාළ මෙවලම් භාවිතයෙන් රූපමය දෘ ඇතුළත් කොට සංස්කරණය කරයි • අවශ්‍ය විටෙකසමීකරණ, සලකුණු, බිඳුම්, දිනය හා වේලාව ආදිය ඇතුලත් කරයි • අදාළ කෙටි මං යතුරු භාවිත කරයි • වඩා කැමති ක්‍රමයක් යොදා ගනිමින් වගු නිර්මාණය කරයි • නිර්මාණය කරන ලද වගුවකට පේළි හා තීර ඇතුළත් කරයි • වගුවක ඇති අනවශ්‍ය පේළි හා තීර මකා දමයි • කොටු හැඩසව් ගැන්වීම් යොදාගනී	**06**

නිපුණතාව	නිපුණතා මට්ටම	විෂය අන්තර්ගතය	ඉගෙනුම් පල	කාලච්ඡේද
		සිත්තම්(Clip art),වදන් සිත්තම්(Word Art),පාඨ කොටු ආදිය • සමීකරණ, සලකුණු, සම්බන්ධක, බිඳුම් සහ දිනය හා වේලාව ඇතුළත් කිරීම • කෙටි මං යතුරු ○ **Open, New, Save, Selectall, Cut, Copy & Paste, Undo/Redo, Print** • වගු නිර්මාණය කිරීම සහ හැඩසවි කිරීම ○ වගු ඇතුළත් කිරීමේ ක්‍රම ▪ මූසිකය ආධාරයෙන් පේළි හා තීරු තේරීම/වගු ඇතුළත් කිරීම/වගු ඇඳීම ○ පේළි හා තීර ඇතුළත් කිරීම සහ මැකීම ○ කොටු එකතු කිරීම හා කොටස්වලට බෙදීම**(Merge and Split)** ○ පේළි පළල හා තීරු උස වෙනස් කිරීම ○ වගු මායිම් රේඛා **(Table Borders)** ○ වගු මෝස්තර **(Table Styles)** • ඡේද හැඩසවි ගැන්වීම • ලේඛනයක් විවිධ ආකාරවලින් සුරැකීම • ලේඛනයක් මුද්‍රණය කිරීම ○ මුද්‍රණය කිරීමේ පූර්ව දර්ශනය ○ මුද්‍රණය කිරීමේ වින්‍යාසය ○ මුද්‍රකයේ ගුණ ○ මුද්‍රණය	• • • වගුවක කොටු ඒකාබද්ධ කරයි, කොටස්වලට බෙදයි • පේළිවල උස හා තීරවල පළල අවශ්‍ය පරිදි වෙනස් කරයි • ලේඛනයක් අවශ්‍යතාව අනුව විවිධ ආකාරවලින් සුරකියි • මුද්‍රණය කිරීමට පෙර, ලේඛනය මුද්‍රණය වන ආකාරය පිළිබඳ පූර්වදර්ශනයක් ලබා ගනී • සකස් කරන ලද ලේඛනයක් අවශ්‍ය මුද්‍රණ සැකසුම් යොදා ගනිමින් මුද්‍රණය කරයි	
	4.2සරල ගණිත ගැටලු විසඳීම සඳහා පැතුරුම් පත් මෘදුකාංග	• පැතුරුම් පත් මෘදුකාංග හැඳින්වීම • පැතුරුම් පත් මෘදුකාංගවල චිත්‍රක අතුරු මුහුණත ○ වැඩ පොත ○ වැඩ පත ○ පේළි	• පැතුරුම් පත් මෘදුකාංග සංක්ෂිප්ත ව විස්තර කරයි • බහුල ව දක්නට ලැබෙන පැතුරුම්පත් මෘදුකාංග ලැයිස්තු ගත කරයි • පැතුරුම් පත් මෘදුකාංගවල	**06**

නිපුණතාව	නිපුණතා මට්ටම	විෂය අන්තර්ගතය	ඉගෙනුම් පල	කාලච්ඡේද
	භාවිත කරයි	○ තීරු ○ කෝෂය ○ සූත්‍ර තීරුව ○ මූසික දර්ශකයේ පෙනුම අනුව එහි ක්‍රියාකාරිත්වය • වැඩපතක එහා මෙහා යාම • කෝෂයක ඇතුළත් කළ හැකි දත්ත ප්‍රරූප ○ පාඨ **(Text)** ○ සංඛ්‍යාංක **(Numbers)** ○ සූත්‍ර**(Formula)** • කෝෂ හැඩසවි ගැන්වීම ○ සංඛ්‍යා ○ චිකෙල්ල කිරීම ○ අක්ෂර • පේළි සහ තීරු ඇතුළත් කිරීම • පේළි, තිරු සහ කෝෂ මකා දැමීම • වැඩපත ○ නැවත නම් කිරීම ○ ඇතුළත් කිරීම ○ මකා දැමීම • කෝෂ පරාස තේරීම හා නම් කිරීම • කෝෂයක අඩංගු දෑ කොපි කිරීම හා විතැන් කිරීම ○ **Cut, Copy, PasteසහPaste special** • සරල ගණිත කර්ම ○ ගණිතමය කාරක**(+, -,*,/)** යොදා ගනිමින් සිදු කරන අංක ගණිතමය ගණනය කිරීම් ○ කෝෂ යොමු හා කාරක ඇසුරින් ගණනය කිරීම්	කාර්යයන් ලැයිස්තු ගත කරයි • පැතුරුම් පත් මෘදුකාංගවල චිත්‍රක අතුරු මුහුණතේ සංරචක හා ලක්ෂණ හඳුනාගනී • වැඩපතක එහා මෙහා යයි කෝෂයක ඇතුළු කළ හැකි දත්ත ප්‍රරූප ලැයිස්තු ගත කරයි • අදාළ පරිදි කොටු හැඩසවි ගැන්වීම යොදාගනී • අවශ්‍ය පරිදි පේළි හා තිරු ඇතුළත් කරයි • අවශ්‍ය නොවන පේළි තිරු හා මකා දමයි • අවශ්‍ය පරිදි වැඩපත් ඇතුළත් කරයි, මකා දමයි සහ නැවත නම් කරයි • කෝෂ පරාසයක් තෝරා නම් කරයි • කෝෂයක අඩංගු දෑ කොපි කිරීම හා විතැන් කිරීමඅවශ්‍ය පරිදි සිදු කරයි • අගයන් හා මූලික ගණිතමය කාරක භාවිතයෙන් මූලික ගණිත කර්ම සිදු කරයි • සාපේක්ෂ හා නිරපේක්ෂ කෝෂ යොමු භාවිතයෙන් මූලික ගණිත කර්ම සිදු කරයි • අභ්‍යන්තර ශ්‍රිත යොදා ගනිමින් මූලික ගණිත කර්ම සිදු කරයි • අවශ්‍ය පරිදි සුදුසු ප්‍රස්තාර වර්ගය හඳුනා ගනී • ප්‍රස්තාර නිර්මාණය කරයි	

නිපුණතාව	නිපුණතා මට්ටම	විෂය අන්තර්ගතය	ඉගෙනුම් පල	කාලච්ඡේද
		– සාපේක්ෂ කෝෂ යොමු – නිරපේක්ෂ කෝෂ යොමු • අභ්‍යන්තර ව සකසා ඇති ශ්‍රිත ○ **Sum, Average, Min, Max, Countසහ Rank** • ප්‍රස්තාර වර්ග ○ ස්තම්භප්‍රස්තාර, තීර ප්‍රස්තාර, වට(වෘත්ත) ප්‍රස්තාර සහ රේඛා ප්‍රස්තාර • ප්‍රස්තාර මෙවලම් ○ පිරිසැලසුම(නිර්මිතිය), වින්‍යාසය, සහ ආකෘතිය • දත්ත පෙරා ගැනීම • දත්ත තේරීම • වැඩපතක් මුද්‍රණය කිරීම ○ පිටු සැලසුම ▪ පිටු විකල්ප ▪ සීමාතීර විකල්ප ▪ පිටු විකල්ප ○ මුද්‍රණය කිරීමේ පූර්ව දර්ශනය ○ මුද්‍රණය කිරීම	• තොරතුරු විමසීම සඳහා පෙරීමේ මෙවලම භාවිත කරයි • දත්ත අනුක්‍රමයකට සංවිධානය කිරයි සඳහා තේරීමේ මෙවලම භාවිත කරයි • අවශ්‍ය පරිදි පිටුසැලසුම් කරයි • වැඩපත පූර්ව දර්ශනය කොට මුද්‍රණය කරයි	
	4.3ඉදිරිපත් කිරීමක්, වඩාත් ආකර්ෂණීය ලෙස සිදු කිරීම සඳහා, ඉලෙක්ට්‍රොනික සමර්පණ මෘදුකාංගයක්	• ඉලෙක්ට්‍රොනික සමර්පණ මෘදුකාංග හැඳින්වීම • ඵලදායී සමර්පණයක සහලක්ෂණ • සමර්පණ මෘදුකාංගවල සහලක්ෂණ • සමර්පණ මෘදුකාංගවල භාවිතය • කදා පිරිසැලසුම තේරීම • කදා පසුබිම තේරීම • පාඨ සහ බහුමාධ්‍ය දෑ ඇතුලත් කිරීම • අභිරුචි කදා සංක්‍රාන්තිය සහ සජීවීකරණය යොදා ගැනීම	• ඉලෙක්ට්‍රොනික සමර්පණ මෘදුකාංග කෙටියෙන් පැහැදිලි කරයි • ඵලදායී සමර්පණයක ලක්ෂණ ලැයිස්තු ගතකර පැහැදිලි කරයි • සමර්පණ මෘදුකාංගවල භාවිතය සාකච්ඡා කරයි • සමර්පණ මෘදුකාංගවල සහලක්ෂණ සාකච්ඡා කරයි • සමර්පණ මෘදුකාංගයක් භාවිතයෙන් ආකර්ශණීය ලෙස සමර්පණයක්	**04**

නිපුණතාව	නිපුණතා මට්ටම	විෂය අන්තර්ගතය	ඉගෙනුම් පල	කාලච්ඡේද
	භාවිත කරයි	• සමර්පණ මෘදුකාංගයට ආවේණික කෙටිමං යතුරු • සමර්පණයක් විවිධ ආකාරයෙන් සුරැකීම • සමර්පණයක් විවිධ තේරීම් අනුව මුද්‍රණය කිරීම	නිර්මාණය කරයි • අන්තර්ගතයට සුදුසු පරිදි කදා පිරිසැලසුමක් තෝරා ගනී • කදාව මත පාඨ, වගු, රූප සටහන්, වීඩියෝ සහ හඬ, චිත්‍රක,හැඩතල, පසරු සිත්තම්, වගු, සපන් චිත්‍ර ශීර්ෂ සහ පාදක, පිටු අංක, අධිසම්බන්ධක, ක්‍රියාකාරී බොත්තම් ආදිය ඇතුළත් කරයි • කදා සංක්‍රාන්තිය යොදා ගනී • කදා පසුබිම යොදයි • අන්තර්ගතයට සුදුසු පරිදි කදා අභිරුචි සජීවකරණ යොදා ගනී • ඉදිරිපත් කිරීමක් අවශ්‍ය පරිදිසුරකියි • සකස් කරන ලද සමර්පණය ඉදිරිපත් කරයි • ආවේණික කෙටි මං යතුරු භාවිත කරයි • මුද්‍රණයට පෙර කදා පූර්ව දර්ශනය කරයි • ඉදිරිපත් කිරීමට ගැළපෙන පරිදි මුද්‍රණය කරයි	
	4.4 දත්ත සමුදායක ඇති දත්ත කළමනාකරණය සඳහා දත්ත සමුදාය කළමනාකරණ පද්ධතියක්	• දත්ත සමුදාය හැඳින්වීම • හස්තමය සහ ඉලෙක්ට්‍රොනික් දත්ත සමුදාය වර්ගයන් සැසැඳීම • දත්ත සමුදාය කළමනාකරණ පද්ධති මෘදුකාංග හැඳින්වීම • සමබන්ධක දත්ත සමුදාය කළමනාකරණ පද්ධතියක වස්තු **(Objects)** ▪ වගුව **(Table)**	• දත්ත සමුදාය සංක්ෂිප්ත ව පහදයි • හස්තමය සහ ඉලෙක්ට්‍රොනික් දත්ත සමුදායයන් සසඳා වෙනස දක්වයි • දත්ත සමුදාය කළමනාකරණපද්ධති මෘදුකාංග නිර්වචනය කරයි • දත්ත සමුදාය කළමනාකරණ	

නිපුණතාව	නිපුණතා මට්ටම	විෂය අන්තර්ගතය	ඉගෙනුම් පල	කාලච්ඡේද
	භාවිත කරයි	▪ විමසුම(Query) ▪ පෝරමය (Form) ▪ වාර්තාව (Report) • ක්ෂේත්‍ර නාම • ප්‍රාථමික යතුර සහ ආගන්තුක යතුර • දත්ත ප්‍රරූප ▪ Text ▪ Number ▪ Date/Time ▪ Currency ▪ Yes/No • ක්ෂේත්‍ර සහලක්ෂණ ▪ ප්‍රමාණය ▪ ආකෘතිය • විමසුම් නිර්මාණය කිරීම ▪ ක්ෂෙත්‍ර පෙරා ගැනීම ▪ උපලැකි(Record) පෙරා ගැනීම • උපලැකිතේරීම • පෝරම මායාකරු (Form Wizard) • වාර්තා මායාකරු (Report Wizard)	පද්ධතියක අවශ්‍යතාව හඳුනාගනී • සම්බන්ධක දත්ත සමුදාය කළමනාකරණ පද්ධතියක වස්තු (Objects) ලැයිස්තු ගත කරයි • ක්ෂේත්‍ර භාවිත කොට වගුවක්, නිර්මාණය කරයි • වගුවක්, නිර්මාණය කිරීමේ දී අදාළ දත්ත ප්‍රරූප තෝරා ගනී • ප්‍රාථමික යතුර සහ ආගන්තුක යතුරෙහි වැදගත් කම කෙටියෙන් පැහැදිලි කරයි • ප්‍රාථමික යතුර ක්ෂේත්‍රය සඳහා සුදුසු ම ක්ෂේත්‍රය තෝරා යොදා ගනී • අවශ්‍ය පරිදි සුදුසු ක්ෂේත්‍ර ගුණයන් යොදා ගනී • වගුවලින් අවශ්‍ය දත්ත විමසුම් භාවිතයෙන් තෝරා ගනී • අවශ්‍ය පරිදි උපලැකි තෝරයි • පෝරම මායාකරු ආධාරයෙන් පෝරම නිර්මාණය කරයි • වාර්තා මායාකරු ආධාරයෙන් වාර්තා නිර්මාණය කරයි	06
නිපුණතාවය 05අදහස් ඵලදායී ලෙස ප්‍රකාශ කිරීමට බහුමාධ්‍ය අන්තර්ගතයන්	**5.1**චිත්‍රක මෘදුකාංග භාවිත කර නිශ්චල චිත්‍රක නිර්මාණය කරයි	• චිත්‍රක ප්‍රරූප • රාස්ටර (Raster) චිත්‍රක • දෛශික (Vector) චිත්‍රක • අංකිත අනුරූපයක ගුණ :පික්සලය, විභේදනය (resolution), ප්‍රමාණය, වර්ණය • චිත්‍රක ගොනුආකෘති සහ ඒවායේ ලක්ෂණ Jpg, png, gif, bmp ආදිය	• නිශ්චල අංකිත අනුරූපයක ගුණ කෙටියෙන් විස්තර කරයි • චිත්‍රක මෘදුකාංග මෙවලම් භාවිත කර ආකර්ශනීය චිත්‍රක නිර්මාණය කරයි • අංකිත චිත්‍රක අවශ්‍යතාවට අනුව සංස්කරණය කරයි • පෙනුම වැඩි දියුණු කිරීමට	04

නිපුණතාව	නිපුණතා මට්ටම	විෂය අන්තර්ගතය	ඉගෙනුම් පල	කාලච්ඡේද
නිර්මාණය කරයි		• රූපයක ධාරිතාව සහ සම්පීඩනය: හානිමත් ආකෘති සහ හානිමත් නොවෙන ආකෘති • චිත්‍රක මෘදුකාංගයක මූලික මෙහෙයුම් ▪ විවෘත කිරීම, සුරැකීමසහ සංස්කරණය ▪ රූප ආනයනය ▪ ප්‍රමාණකරණය සහ පරිණාමනය ▪ තෝරාගැනීම් ,කැපීම, කෙටි කිරීම **(crop),** ප්‍රතිස්ථාපනය ▪ ස්තර**(layers)** භාවිතය • පාඨ හැසිරවීම	මූලික පාඨ ප්‍රයෝග භාවිත කරයි	
	5.2ශබ්ද සංස්කරණ මෘදුකාංග භාවිත කර ශ්‍රව්‍ය අන්තර්ගතය සංස්කරණය කරයි	• ශ්‍රව්‍ය අන්තර්ගත පටිගත කිරීම • සංස්කරණය (මූලික අන්තර්ගතයෙන් අදාළ කොටස සංස්කරණය කිරීම) • ශ්‍රව්‍ය ගොනු ආකෘති **Mp3, wav, au** ආදිය.	• ශබ්ද සංස්කරණ මෘදුකාංග භාවිත කර අවශ්‍යතාව අනුව ශ්‍රව්‍ය කොටස් පටිගත කරයි • මූලික අන්තර්ගතයෙන් අදාළ කොටස සංස්කරණය කරයි • අවශ්‍යතාවට අනුව ශ්‍රව්‍ය ගොනු ආකෘති වෙනත් ආකෘතීන්ට පරිවර්තනය කරයි	**02**
	5.3වීඩියෝ සංස්කරණ මෘදුකාංග භාවිත කර වීඩියෝ සංස්කරණය කරයි	• වීඩියෝ මෙහෙයවීම සහ නැවත සකස් කිරීම • වීඩියෝ ගොනු ආකෘති **Mp4, avi, wmv** යනාදිය.	• අවශ්‍යතාවට අනුව වීඩියෝ සංස්කරණය කරයි • අවශ්‍යතාවට අනුව වීඩියෝ ගොනු ආකෘති වෙනත් ආකෘතීන්ට පරිවර්තනය කරයි	**02**

නිපුණතාව	නිපුණතා මට්ටම	විෂය අන්තර්ගතය	ඉගෙනුම් පල	කාලච්ඡේද
නිපුණතාව 06වඩිනෙදා ජීවිතයේ දී තොරතුරුවලට ප්‍රවේශ වීමට හා සන්නිවේදනය කිරීමට අන්තර්ජාලය කාර්යක්ෂම ව භාවිත කරයි	**6.1** අන්තර්ජාලයේ නිර්මිතය ගවේෂණය කරයි	• පරිගණක ජාලවල අවශ්‍යතාව ○ දත්ත සන්නිවේදනය ○ සම්පත් බෙදා හදා ගැනීම • ජාල ප්‍රරූප ○ පුද්ගල ප්‍රදේශ ජාල **(PAN)** ○ ස්ථානීය ජාල **(LAN)** ○ පුළුල් ප්‍රදේශ ජාල **(WAN)** • ජාලයක ඇති සන්නිවේදන උපක්‍රම ○ මොඩමය ○ මංහසුරුව (මාර්ග කාරකය) ○ ජාල අතුරුමුහුණත් කාඩ් පත ○ ස්විචය ○ රුහැන් රහිත ප්‍රවේශ ○ ජංගම සන්නිවේදනය **GPRS,GSM** යනාදිය • සම්බන්ධක ප්‍රරූප ○ නියමු (මාධ්‍යය) ○ නියමු නොවන (මාධ්‍යය) • රුහැන් සහිත සහ රුහැන් රහිත ජාල • ග්‍රාහක-සේවාදායක ආකෘතිය **(Client Server Model)** • සම සම ජාලය **(Peer to peer)** • දෙමුහුන් • වලාකුළු පරිගණනය	• පරිගණක ජාල ගත කිරීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි • ජාල වර්ග නම් කර විස්තර කරයි • පරිගණක ජාලයක සංරචක ලැයිස්තු ගත කර කෙටියෙන් විස්තර කරයි • නියමු සහ නියමු නොවන මාධ්‍ය වෙන් කොට හඳුනාගනී • පහත දැක්වෙන දැ කෙටියෙන් විස්තර කරයි ○ ග්‍රාහක-සේවාදායක ආකෘතිය ○ සම සම ජාලය **(Peer to peer)** ○ දෙමුහුන් • රුහැන් සහිත සහ රුහැන් රහිත ජාල වෙන් කර හඳුනා ගනී	**02**
	6.2 අදාළ තොරතුරු ප්‍රවේශ කර ගැනීම සඳහා අන්තර්ජාල	• වෙබ් ලිපියොමුව **(URL/URI)** • වෙබ් අතරික්සු සහ සෙවුම් යන්ත්‍ර • අන්තර්ජාලය හා එහි සේවා ○ **WWW** ○ තොරතුරු බෙදාගැනීම සහ	• වෙබ් ලිපියොමුව **(URL/URI)** සංක්ෂිප්ත ව පැහැදිලි කරයි • අන්තර්ජාලය හා එහි සේවා සංක්ෂිප්ත ව පැහැදිලි කරයි • තොරතුරු ලබා ගැනීම සඳහා වෙබ්	**02**

නිපුණතාව	නිපුණතා මට්ටම	විෂය අන්තර්ගතය	ඉගෙනුම් පල	කාලච්ඡේද
	සේවා භාවිත කරයි	ඉලෙක්ට්‍රෝනික ගනුදෙනු ○ ඉ-තැපැල් ○ සමාජ මාධ්‍ය ○ අන්තර්ජාල පාදක වීඩියෝ සහ පාඨ සන්නිවේදනය(**IRC, SMS, video calls etc.)** ○ **Blogging and Micro Blogging** ○ වලාකුළු පරිගණනය ○ වලාකුළු පාදක සේවා • සාර්ව ද්‍රව්‍ය අන්තර්ජාලය (Internet of Things (IOT)) ○ නිර්වචනය ○ සහලක්ෂණ ○ අවශ්‍යතාව ○ යෙදුම් ○ බලපාන්නා වූ තාක්ෂණ	අතරික්සු සහ සෙවුම් යන්ත්‍ර භාවිත කරයි • ඉ-තැපැල් ගිණුමක් ආරම්භ කරයි • ඉ-තැපැල් හරහා තොරතුරු සන්නිවේදනය කරයි • අවශ්‍ය තොරතුරු බාගත කර ගනියි • සන්නිවේදනය සඳහා අන්තර්ජාල පාදක ක්‍රම **(IRC, SMS, video calls etc)** භාවිත කරයි • **Blogging and Micro Blogging** අර්ථ නිරූපණය කරයි • බ්ලොග් අඩවියක් නිර්මාණය කර, එමඟින් තොරතුරු බෙදා ගනී • වලාකුළු පරිගණනය නිර්වචනය කරයි • දත්ත හෝ තොරතුරු හෝ ගබඩා කිරීම, කළමනාකරණය හා සැකසීම සඳහා වලාකුළු පරිගණනය යොදා ගනී • සාර්ව ද්‍රව්‍ය අන්තර්ජාලය **(IOT)** නිර්වචනය කරයි • සාර්ව ද්‍රව්‍ය අන්තර්ජාලයෙහි සහලක්ෂණ කෙටියෙන් පැහැදිලි කරයි • සාර්ව ද්‍රව්‍ය අන්තර්ජාලයෙහි අවශ්‍යතාව හඳුනා ගනී • සාර්ව ද්‍රව්‍ය අන්තර්ජාලයෙහි යෙදුම් සාකච්ඡා කරයි • සාර්ව ද්‍රව්‍ය අන්තර්ජාලයට බලපාන්නා වූ තාක්ෂණ හඳුනා ගනී	

නිපුණතාව	නිපුණතා මට්ටම	විෂය අන්තර්ගතය	ඉගෙනුම් පල	කාලච්ඡේද
නිපුණතාව 07බහු මාධ්‍යය සංරචක ඇතුළත් කර වෙබ් අඩවි සංවර්ධනය කරයි	**7.1** පිටු සහ අන්තර්ගතය සංවිධානය කිරීමට සැකසුම සහ වෙබ් අඩවි සංයුතිය ගවේෂණය කරයි	• වෙබ් අඩවියේ අන්තර්ගතය ▪ මුල් පිටුව ▪ සම්බද්ධ පිටු • වෙබ් පිටුවක තැනුම් ඒකක ▪ පාඨ,චිත්‍රක, ශ්‍රව්‍ය,දෘශ්‍ය සජීවකරණ ▪ අධිසම්බන්ධක • අන්තර්ගතය සංවිධානය ▪ පිරිසැලසුම,රාමු, ලැයිස්තු වගු	• වෙබ් අඩවියක පිටු හඳුනාගනියි • වෙබ් පිටුවක අන්තර්ගතය හඳුනාගනියි • වෙබ් පිටුවක අන්තර්ගතයේ සැකැස්ම විශ්ලේෂණය කරයි	**01**
	7.2 වෙබ් පිටුවක පරිශීලක අවශ්‍යතා (බහු මාධය අන්තර්ගතය) විශ්ලේෂණය කරයි	• වෙබ් අඩවියක අරමුණු අර්ථ දැක්වීම • සන්දර්ශනය විය යුතු අන්තර්ගතය	• වෙබ් පිටුවකට ඵලදායී සහ උචිත වූ තොරතුරු පිරිසැකසුමක් නිර්මාණය කරයි	**01**
	7.3 වෙබ් පිටු නිර්මාණය කිරීමට **HTML** භාවිත කරයි	• අධිපාඨ සලකුණු කිරීමේ භාෂාව හැඳින්වීම • වෙබ් පිටුවක මූලික **HTML** උසුලන (ටැග්ස්) ▪ පිටු නිර්වචනය ▪ **<html>, </html>** ▪ සිරස් අංශය ▪ **<head></head>** ▪ **<title></title>** ▪ කඳ කොටස	• අධිපාඨ සලකුණු කිරීමේ භාෂාවිශ්ලේෂණ කරයි • ප්‍රභව ලේඛන සුදුසු දිගු සහිත ව සුරකියි • පරිශීලකගේ අවශ්‍යතාවලට අනුව උචිත වූ බහු මාධ්‍ය වස්තු ඇතුළත් කර වෙබ් පිටුව නිර්මාණය කරයි • වෙබ් පිටුවල දත්ත සංවිධානය කිරීමට ලැයිස්තු භාවිත කරයි	**06**

නිපුණතාව	නිපුණතා මට්ටම	විෂය අන්තර්ගතය	ඉගෙනුම් පල	කාලච්ඡේද
		▪ **<body></body>** ▪ පසුබිම් වර්ණය**(Background color)** ▪ පාඨ හැඩසවි ගැන්වීම ▪ **<h1>…<h7>tags** ▪ ** ** ▪ ** ** ▪ **Underline, bold , italic** ▪ **<font:>** • **Size and colour** ▪ විවරණ එක් කිරීම ▪ ලැයිස්තු ▪ පරිපාටිගත ලැයිස්තු ▪ නිප්පර්පාටිගතලැයිස්තු • බහුමාධ්‍ය වස්තු ▪ චිත්‍රක ▪ ශ්‍රව්‍ය ▪ දෘශ්‍ය		
	7.4 වෙබ් පිටු නිර්මාණයට සම්පාදක මෙවලම් භාවිත කරයි	• සම්පාදක මෙවලම් හැඳින්වීම	• සරල වෙබ් පිටුවක් නිර්මාණයට සම්පාදක මෙවලම් භාවිත කරයි	**02**
නිපුණතාව 08. දිවි මඟ ජයගැනුම සඳහා තොරතුරු හා	**8.1** ජාතික සංවර්ධනය උදෙසා තොරතුරු හා	• තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ යෙදීම් ○ අධ්‍යාපනය ▪ ඉගෙනුම/ඉගැන්වීම	• තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ වාසි අවාසි සාකච්ඡා කරයි • තොරතුරු හා සන්නිවේදන	**02**

නිපුණතාව	නිපුණතා මට්ටම	විෂය අන්තර්ගතය	ඉගෙනුම් පල	කාලච්ඡේද
සන්නිවේදන තාක්ෂණය කාර්යක්ෂම හා ඵලදායී ලෙස භාවිත කරයි	සන්නිවේදන තාක්ෂණයේ දායකත්වය පැහැදිලි කරයි	▪ ඉගෙනුම් කළමනාකරණ පද්ධති ▪ පාසැල් කළමනාකරණ පද්ධති • සෞඛ්‍යය ○ විමර්ශන මෙවලම්(**MRI scan, CAT scan** ආදිය) ○ සෞඛ්‍ය අධ්‍යාපනයේ දී සමරූපණ ○ දූරස්ථ වෙදකම • කෘෂිකර්මය ○ ග්‍රාමීය කෘෂි ප්‍රජාව සම්බන්ධ කිරීම ○ පරිපාලනය සමඟ සන්නිවේදනය කිරීම ○ කාලගුණය පිළිබඳ තොරතුරු ○ පරිගණක පාලිත මෙවලම් • ඉ-ව්‍යාපාර කටයුතු ○ සංචාරක ○ මාර්ගගත සාප්පු සවාරි ○ බැංකුකරණය(ටෙලර් යන්ත්‍ර, ණය කාඩ් පත්) ○ මාර්ගගත රැකියා • ඉ-රාජ්‍ය පාලනය ○ හැඳුනුම්පත්, රියදුරු බලපත්‍ර, ගමන් බලපත්‍ර ආදිය නිකුත් කිරීම ○ උප්පැන්න, විවාහ, මරණ ආදි සහතිකපත් නිකුත් කිරීම	තාක්ෂණය භාවිතයට ගැනෙන විවිධ අවස්ථා ලැයිස්තු ගත කර කෙටියෙන් විස්තර කරයි • ජාතික සංවර්ධනයේ අභිවෘද්ධිය උදෙසා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ දායකත්වය අගය කරයි	
	8.2 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රය තුළ තමාට ගැළපෙන වෘත්තීය අවස්ථා සහ	• තොරතුරු තාක්ෂණ වෘත්තියට අදාළ රැකියා අවස්ථා ○ මෘදුකාංග ඉංජිනේරු ○ මෘදුකාංග තත්ත්ව පාලක ඉංජිනේරු ○ ව්‍යාපාර විශ්ලේෂක ○ තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති කළමණාකරු ○ චිත්‍රක නිර්මාණකරු ○ මෘදුකාංග නිර්මාණ ශිල්පී	• තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රය තුළ පවතින රැකියා අවස්ථා හඳුනා ගනී • එක් එක් රැකියාවට අදාළ කාර්යයන් හඳුනා ගනී • එක් එක් රැකියාවට අදාළ පුහුණු පුහුණු අවශ්‍යතා හා සුදුසුකම් හඳුනා ගනී	**01**

නිපුණතාව	නිපුණතා මට්ටම	විෂය අන්තර්ගතය	ඉගෙනුම් පල	කාලච්ඡේද
	මාර්ග අන්වේෂණය කරයි	○ තත්ත්ව පාලන නායක ○ ජාල පරිපාලක ○ දත්ත සමුදාය පරිපාලක ○ පරිගණක යෙදුම් සහායක ○ තොරතුරු තාක්ෂණ කළමනාකරු		
	8.3 අදාළ වාද විෂයයන් පිළිබඳ ව අවබෝධයකින් යුක්ත ව, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සුරක්ෂිත ව භාවිත කරයි	• සාරධර්ම හා නෛතික වාද විෂයයන් ○ අන්තර්ජාල අපරාධ **(Cyber Crimes)** ○ පෞද්ගලිකත්වය ○ චෞරත්වය ○ ඊ - නීති ○ ශ්‍රී ලංකා පරිගණක හදිසි සූදානම් කණ්ඩායම **(SLCERT)** ○ අනවසර ප්‍රවේශය ○ ජාල අවකාශයේ ආචාරශීලී සැරිම් ▪ **Cyber stalking** ▪ බුද්ධිමය දේපළ (හිමිකම, **Patent** බලපත්‍රය) ▪ නොදන්වා උපුටා ගැනීම ▪ රහස් තර්ජනය • සමාජ මාධ්‍ය භාවිතයේ සාරධර්ම හා නෛතික වාද විෂය ▪ අනුචිත ද්‍රව්‍ය • ආරක්ෂාව ○ දෘඩාංග ආරක්ෂාව ▪ භෞතික ආරක්ෂාව (ගේට්ටු, ආරක්ෂිත දොරගුල් ආදිය) • **UPS** • **Surge arrestors** ▪ පාරිසරික ආරක්ෂාව • දූවිලි, තෙතමනය, උෂ්ණත්වය ආදියෙන් ආරක්ෂාව)	• තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය තුළ සාරධර්ම හා නෛතික වාද විෂය හඳුනා ගෙන සංක්ෂිප්ත ව පහදයි • ඉ-නීතියක් හා **SLSERT** වැනි ආයතන පවතින බව දැනගනී • සමාජ ජාල/මාධ්‍යවල යහපත් හා අයහපත් බලපෑම ලැයිස්තු ගත කරයි • පරිගණක පද්ධතියට විල්ල විය හැකි තර්ජන හඳුනාගනී • දෘඩාංග හා මෘදුකාංග ආරක්ෂාව සඳහා අවශ්‍ය පියවර ගනී • පරිස්සම් රහිත ව අන්තර්ජාලය භාවිතයේ දී පැනනැඟිය හැකි වාද විෂයයන් හඳුනාගෙන ඒවා අවම කර ගැනීම සඳහා ආරක්ෂක පියවර ගනී • පරිගණකය ආශ්‍රිත ව ඇති විය හැකි රෝගාබාධ හඳුනාගෙන ඒවායින් ආරක්ෂා වීම සඳහා අවශ්‍ය පියවර ගනී • යහපත් හා අයහපත් පරිගණක පුරුදු පිළිබඳ ව අවබෝධයක් ලබා ගනී • ඉ- අපද්‍රව්‍ය නිර්වචනය කරයි • ඉ- අපද්‍රව්‍ය නිවැරදි අන්දමින් බැහැර	**03**

නිපුණතාව	නිපුණතා මට්ටම	විෂය අන්තර්ගතය	ඉගෙනුම් පල	කාලච්ඡේද
		• ස්වාභාවික ව්‍යසනවලින් ආරක්ෂාව ○ මෘදුකාංග ආරක්ෂාව ▪ ප්‍රතිවෛරස, ගිනි පවුරු ආදිය • අන්තර්ජාල භාවිතයේ දී පූර්වාරක්ෂා • සෞඛ්‍යය හා රැකවරණය ○ පුනරාවර්තී ආතති සහලක්ෂණය ▪ ඇස් රුදාව, කොඳු ඇට පේලියේ වේදනාව ○ ඉඅපද්‍රව්‍ය සහ හරිත ආගණනය	නොකිරීමෙන් සිදු විය හැකි අහිතකර බලපෑම් කෙටියෙන් පැහැදිලි කරයි • ඉ- අපද්‍රව්‍ය නිවැරදි අන්දමින් බැහැර කරයි • හරිත ආගණනය හඳුනාගෙන අගය කරයි • නිරතුරු ව පරිගණකය භාවිතයෙන් ඇතිවිය හැකි ආබාධ අවම කර ගැනීමට, අදාළ වැඩපළ ක්‍රියාකාරකම් සිදු කරයි	

ගුරු මාර්ගෝපදේශය

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

නිපුණතාවය 01 : කාලීන ප්‍රතිලාභ නෙළා ගැනීම සඳහාපරිගණකය සහ එහි විභවය ගවේෂණය කරයි

නිපුණතා මට්ටම 01.1: මූලික තැනුම් ඒකක රූප සටහන ඇසුරින්, පරිගණක පද්ධතිය විස්තර කරයි

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගෙනුම් පල :

- පද්ධතියක් නිර්වචනය කරයි
- පරිගණකය පද්ධතියක් ලෙස හඳුනා ගනියි(IPO)
- පරිගණකය පද්ධතියක සංරචකයක් ලෙස පිළිගනියි
- පරිගණක දෘඩාංග ලැයිස්තු ගත කර, සංක්ෂිප්ත ව විස්තර කරයි
- පර්යන්තඋපාංග, ආදාන, ප්‍රතිදාන සහ ආදාන/ප්‍රතිදාන උපාංග ලෙස වෙන්කොට හඳුනාගනී
- පරිගණක මෘදුකාංග ප්‍රරූප ලැයිස්තු ගත කර, සංක්ෂිප්තව විස්තර කරයි
- පරිගණකයේ මූලික තැනුම් ඒකක රූසටහන ඇඳ එහි සංරචක නම් කරයි
- එම එක් එක් සංරචකය කෙටියෙන් පැහැදිලි කරයි
- දත්ත සහ තොරතුරු උදාහරණ සහිත ව වෙන් කොට හඳුනාගනී
- ගුණාත්මක තොරතුරුවල ගතිලක්ෂණ නම්කොට කෙටියෙන් විස්තර කරයි

විෂය අන්තර්ගතය :

- පද්ධති සංකල්පය
- පරිගණකය හැඳින්වීම
- පරිගණකයේ සංරචක
  - දෘඩාංග
    - ආදාන/ප්‍රතිදාන උපාංග
    - මතක උපාංග **(RAM, ROM Cache)**
    - ආචයන උපාංග(ප්‍රකාශ, චුම්බක, අර්ධ සන්නායක)
    - සකසනය
  - මෘදුකාංග
    - පද්ධති මෘදුකාංග
    - යෙදුම් මෘදුකාංග
- පරිගණකයේ තැනුම් ඒකක රූසටහන **(Block Diagramof a Computer)**
  - ආදාන
  - සැකසුම් ඒකකය**(ALU, CU)**
  - ප්‍රතිදාන
  - මතක/ආචයන
  - පරිගණකයේ උපාංග අතර දත්ත සහ මෙහෙයුම් විධාන ගලායාම

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

- දත්ත සහ තොරතුරු
- ගුණාත්මක තොරතුරුවල ගති ලක්ෂණ

මූලික වදන්/සංකල්ප

- පද්ධතියක නිර්වචනය
- අංකිත පරිගණකයක් පද්ධතියක් ලෙස හඳුනා ගැනීම
- පරිගණකයක මූලික රූ සටහන සහ වොන් නියුමාන් නිර්මිතිය
- පරිගණක දෘඩාංග සහ පරිගණක මෘදුකාංග
- දත්ත සහ තොරතුරු
- දත්ත සහ තොරතුරු සාපේක්ෂ වශයෙන් වෙනස් විය හැකි බව සහ දත්ත ක්‍රියාවලියකට භාජනය වන දෑ වන බවද එම ක්‍රියාවේ ප්‍රතිදාන ලෙස තොරතුරු ලැබෙන බව ද අවධාරණය කිරීම. ඒ අනුව යම් අවස්ථාවක දත්ත වන දෑ වෙනත් අවස්ථාවක දී තොරතුරු ලෙස හඳුනා ගත හැකි බව

පාඩම් සැලසුම් සඳහා උපදෙස්

- පද්ධතියක් යනු කුමක් දැයි සාකච්ඡා කරන්න
- අංකිත පරිගණකයක් පද්ධතියක් ලෙස සාකච්ඡා කරන්න
- ආදාන, ක්‍රියාවලිය හා ප්‍රතිදාන ඇසුරින් පරිගණකයේ මූලික රූසටහන හඳුන්වා දීම
- මෙම සටහන භෞතික පරිගණකය සමඟ සැසඳීම
- පරිගණක පද්ධතියේ සංරචක පිළිබඳ ව සාකච්ඡාවක් මෙහෙයවීම
- පරිගණකයේ සංරචක ප්‍රදර්ශනය කිරීම
- වොන් නියුමාන් ආකෘතිය, රූසටහන් හා උපාංග අනුසාරයෙන් හඳුන්වා දීම
- දත්ත සහ තොරතුරු සුදුසු උදාහරණ සහිත ව සාකච්ඡා කිරීම
- ගුණාත්මක තොරතුරුවල සාධනීය ලක්ෂණ සාකච්ඡා කිරීම

ගුණාත්මක යෙදවුම්

- පරිගණක, බහුමාධ්‍ය ප්‍රක්ෂේපණය, විවිධ මෘදුකාංග සහිත සංගෘහිත තැටි/ අංකිත වීඩියෝ තැටි

ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්

- පරිගණකයේ සංරචක වර්ගීකරණය කිරීම සඳහා පැවරුමක් දීම
- වොන් නියුමාන් ආකෘතිය ඇඳ නම් කිරීම සඳහා සිසුන්ට උපදෙස් දීම
- දෙන ලද අවස්ථාවන් ට අදාළ ව දත්ත සහ තොරතුරු වෙන් කිරීමට සිසුනට පැවරීම
- ගුණාත්මක තොරතුරුවල එක් එක් ලක්ෂණයට අදාළ ව උදාහරණ ලබා දෙන ලෙස සිසුනට උපදෙස් දීම (ලක්ෂණ 5ක් වත්)

ගුණාත්මක යෙදවුම්

- පරිගණක, බහුමාධ්‍ය ප්‍රක්ෂේපණය, විවිධ මෘදුකාංග සහිතව සංගෘහීත තැටි/ අංකිත විඩියෝ තැටි

AlevelApi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

නිපුණතා මට්ටම 1.2 : පුද්ගල පරිගණකවල දෘඪාංග පිරිවිතර හඳුනා ගනී

කාලච්ඡේද සංඛ්‍යාව : 01

ඉගෙනුම් පල :

- අවශ්‍යතාව සහ මූල්‍ය හැකියාව අනුව සුදුසු පුද්ගල පරිගණක පිරිවිතර හඳුනාගෙන, තෝරා ගනී
- පරිගණකයක් සහ පර්යන්ත උපාංග සඳහා පිරිවිතර සකසයි
- පරිගණකයේ ක්‍රියාකාරීත්වයට සහ මනා පැවැත්මට අවශ්‍ය මෘදුකාංග තෝරාගනී

විෂය අන්තර්ගතය :

- **පුද්ගල පරිගණක දෘඪාංග පිරිවිතර**
    - සකසනයේ පිරිවිතර
        - වෙළඳ නාමය
        - වේගය
    - මතක ධාරිතාව
    - දෘඪ තැටියේ ධාරිතාව
    - කෙවෙනි
    - මවු පුවරුව
    - **Chip set**
    - තිරය/මොනිටරය
    - චිත්‍රක සකසන ඒකකය **(Graphic Processing Unit)**
- **පුද්ගල පරිගණක සඳහා මෘදුකාංග පිරිවිතර**
    - පද්ධති මෘදුකාංග
    - යෙදුම් මෘදුකාංග
    - උපයෝගිතා මෘදුකාංග

මූලික වදන්/සංකල්ප :

- පුද්ගල පරිගණක සංකල්පය
- පුද්ගල පරිගණකයක වැදගත් දෘඪාංග පිරිවිතර හඳුනා ගැනීම
- පුද්ගල පරිගණකයක මෘදුකාංග පිරිවිතර හඳුනා ගැනීම

පාඩම් සැලසුම් සඳහා උපදෙස් :

- දෙන ලද අවස්ථාවලට සුදුසු පරිගණක පිරිවිතර ලැයිස්තුවක් පිළියෙළ කරන ලෙස උපදෙස් දීම (උදා. වීඩියෝ සංස්කරණය, පුස්තකාලයය, පරිගණක විද්‍යාගාරය, පාසල් කාර්යාලයය, විනෝදාස්වාදය ආදිය)

ගුණාත්මක යෙදවුම් :

- වෙළඳපලේ පවතින පුද්ගල පරිගණක පිළිබඳ ව වෙළඳ දැන්වීම්, අන්තර්ජාල සම්බන්ධතාවය සහිත පරිගණක

ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- සුදුසු අවස්ථාවක් ලබාදී එයට අදාළ දෘඪාංග හා මෘදුකාංග පිරිවිතර ලැයිස්තුවක් පිළියෙළ කිරීමට උපදෙස් දීම

AlevelApi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

කියවීම් ද්‍රව්‍ය

පද්ධතියක් හැඳින්වීම

පද්ධතියක් යනු, නීති රීති මාලාවක්, ද්‍රව්‍යවල සැකසුමක්, හෝ නිශ්චිත ඉලක්කයක් හෝ කෙරෙහි එක් ව ක්‍රියාත්මක වන එකිනෙකට සම්බන්ධ කොටස් සමූහයකි. සෑම පද්ධතියක ම ආදාන, ක්‍රියාවලිය සහ ප්‍රතිදාන යන මූලික කොටස් තුනෙන් සමන්විත ආකෘතියක් අඩංගු වේ(IPO). ඒවා මඟින් පද්ධතියේ ව්‍යූහය විස්තර කෙරෙයි.

පරිගණකය හැඳින්වීම

කිසියම් ආකාරයක දත්ත ලබා ගෙන, කලින් තීරණය කර ඇති උපදෙස් මාලාවකට (වැඩසටහන්)අනුව ක්‍රියාත්මක වී තොරතුරු ආකාරයේ ප්‍රතිදානයක් ලබා දීමේ හැකියාවක් සහිත ඉලෙක්ට්‍රොනික උපකරණයක් ලෙස පරිගණකය හැඳින්විය හැකි ය.



පරිගණකය පද්ධතියක් ලෙස

පරිගණකය යනු නිශ්චිත කාර්යයක් ඉටු කිරීම සඳහා ඒකකයක් වශයෙන් ක්‍රියාත්මක වන (බොහෝ විට පරිශීලක ද සමඟ) සංවිධානය වූ දෘඪාංගවල සහ මෘදුකාංගවල එකතුවකි. ඉහත රූපයෙන් විදහා දැක්වෙන පරිදි පරිගණකය ආදාන, ක්‍රියාවලිය සහ ප්‍රතිදාන (IPO) ආකෘතිය අනුගමනය කරයි. එබැවින් පරිගණකය පද්ධතියක් ලෙස වර්ගීකරණය කළ හැකි ය.

පරිගණකය පද්ධතියක් වන හෙයින්, එහි එක් එක් කොටස්වලට තනි ව ක්‍රියාත්මක විය නොහැකි ය.පරිගණකය ක්‍රියාත්මක වීම සඳහා එහි කොටස් නිසි පරිදි එකිනෙකට සම්බන්ධ කළ යුතු ය.

පරිගණකයේ මූලික කොටස් නම්:

- යතුරු පුවරුව සහ මූසිකය
- පද්ධති ඒකකය
- මොනිටරය

එම මූලික කොටස්වල කාර්ය පහත දැක්වේ:

- යතුරු පුවරුව සහ මූසිකය දත්ත සහ උපදෙස් ඇතුළු කිරීමට යොදා ගැනේ
- පද්ධති ඒකකය දත්ත සහ තොරතුරු සැකසීම සිදු කරයි

AlevelApi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

- මොනිටරය හෙවත් තිරය මඟින් ප්‍රතිදාන වන තොරතුරු පරිශීලකට ප්‍රදර්ශනය කරයි

පර්යන්ත උපාංග

පරිගණකයේ හැකියාවන් පුළුල් කිරීම සඳහා එයට සම්බන්ධ කරනු ලබන දෘඪාංග කොටස් පර්යන්ත උපාංග ලෙස හැඳින්වේ. පරිගණකයේ මූලික කොටස් අවශ්‍යයෙන් ම තිබිය යුතු වන අතර, පර්යන්ත උපාංග අවශ්‍ය පරිදි විකල්ප ලෙස භාවිත කළ හැකි ය. විවිධ අන්දමේ පර්යන්ත උපාංග පරිගණකයට අභ්‍යන්තර හෝ බාහිර හෝ වශයෙන් සම්බන්ධ කළ හැකි ය.

නවීන පරිගණකවල සියලුම උපාංග පොදු බසයක් හරහා පරිගණකයට සම්බන්ධ වන හෙයින්, ඒවා පහත දැක්වෙන පරිදි වර්ගීකරණය කළ හැකි ය

- **ආදාන/ප්‍රතිදාන උපාංග**
    - **ආදාන උපාංග :** දත්ත සහ උපදෙස් පරිගණකයට ඇතුළත් කිරීම සඳහා යොදා ගන්නා උපාංග
    - **ප්‍රතිදාන උපාංග** : පරිගණකයෙන් තොරතුරු ලබා ගැනීමට යොදා ගනු ලබන උපාංග
    - **ආදාන/ප්‍රතිදාන උපාංග :** ආදාන සහ ප්‍රතිදාන යන ක්‍රියා දෙක ම සඳහා යොදා ගත හැකි උපාංග
    - **ආචයන උපාංග :** පසු ප්‍රයෝජනය සඳහා දත්ත සහ තොරතුරු ගබඩා කොට තබා ගැනීම සඳහා යොදා ගත හැකි උපාංග
- **සැකසුම් උපාංග :** දත්ත, තොරතුරු බවට පත් කිරීම සඳහා යොදා ගැනේ. ක්ෂුද්‍ර සකසනයසහ අනෙකුක් සකසන සහ චිප(chips) මෙයට අයත් වේ

ආදාන උපාංග : පරිගණකයට දත්ත සහ උපදෙස් ඇතුළත් කිරීම සඳහා යොදා ගන්නා උපාංග

- යතුරුපුවරුව
- මූසිකය
- චිත්‍රක ඵලකය
- ස්පර්ශක ඵලකය
- තීරු-කේත කියවනය
- ඩිජිටල් කැමරාව
- වෙබ් කැමරාව
- Joystick
- මයික්‍රොෆෝනය
- පරිලෝකනය
- ප්‍රකාශ සලකුණු කියවනය (OMR)
- ප්‍රකාශ අනුලක්ෂණ කියවනය (OCR)
- චුම්බකිත තීන්ත අනුලක්ෂණ කියවනය (MICR)
- RFID (Radio Frequency IDenfication)කියවනය

AlevelApi.com උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

ප්‍රතිදාන උපාංග : පරිගණකයෙන් තොරතුරු ලබා ගැනීමට යොදා ගනු ලබන උපාංග

- මොනිටරය(LED, LCD, CRT etc)
- මුද්‍රක(සියලු වර්ග)
- ප්ලොටරය
- ප්‍රක්ෂේපණය
- ස්පීකර්
- Head Phone

ආදාන/ප්‍රතිදාන උපාංග

- ස්පර්ශක තිරය
- ශීර්ෂ කට්ටලය (Headsets)- Headset consists of Headphones and Microphone
- Electronic Whiteboard

ආචයන උපාංග

- චුම්බක (දෘඪ තැටි, පටි ආදිය.)
- ප්‍රකාශ (සංගෘහීත තැටි(CD/DVD/Blu-Ray Disc ආදිය)
- ඝන අවස්ථාව (Flash drives, Memory cards etc.)

ප්‍රාථමික ආචයන උපාංග

සකසනයට සෘජු ව ම ප්‍රවේශ විය හැකි ආචයන උපාංග (RAM, ROM and cache memory)

ද්විතියක ආචයන උපාංග

සකසනයට සෘජු ව ම ප්‍රවේශ විය නොහැකි ආචයන උපාංග (චුම්බක තැටි, ප්‍රකාශ තැටි, ඝන අවස්ථාවේ ආචයන උපාංග)

මෘදුකාංග

පරිගණකය සහ ඒ හා සම්බන්ධ උපාංග ක්‍රියාත්මක කිරීමට යොදා ගනු ලබන විවිධ වැඩසටහන් සඳහා පොදු වශයෙන් මෘදුකාංග යන වචනය යොදා ගැනේ.

ප්‍රධාන වශයෙන් මෘදුකාංග කොටස් දෙකකට බෙදේ

- පද්ධති මෘදුකාංග
- යෙදුම් මෘදුකාංග

පද්ධති මෘදුකාංග

පරිගණකයේ සියලු ම කාර්යයන් සම්බන්ධීකරණය හා මෙහෙයවීම සහ දෘඩාංග කළමනාකරණය පද්ධති මෘදුකාංග මඟින් සිදු කෙරේ. එමෙන් ම යෙදුම් මෘදුකාංග ක්‍රියාත්මක වීම සඳහා පසුබිම සකසයි. දෘඩාංගවල සංකීර්ණත්වය සඟවා, යෙදුම් මෘදුකාංග සහ දෘඩාංග අතර අතුරුමුහුණතක් මෙයින් සපයයි.

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

උදා :

- **Basic Input/output System(BIOS)**
- මෙහෙයුම් පද්ධතිය
- උපාංග ධාවක
- උපයෝගිතා මෘදුකාංග**(Disk cleanup, Disk optimizer, Antivirus, back up etc.)**

යෙදුම් මෘදුකාංග

පරිශීලකගේ කාර්යයන් ඉටු කර ගැනීම සඳහා යොදා ගන්නා මෘදුකාංග. පද්ධති මෘදුකාංග සහ පරිශීලක අතර ක්‍රියාත්මක වේ. පරිශීලක වෙතින් ලබා ගන්නා දත්ත පරිශීලක අවශ්‍යතාවට අනුව සකස් කරයි.

උදා :

- වදන් සැකසුම්
- පැතුරුම්පත්
- සම්ර්පණ/ චිත්‍රක
- දත්ත සමුදාය
- වෙබ් අතරික්සු
- **Media Player**

සකසනය


දත්ත, තොරතුරු බවට පරිවර්තනය කරයි.

සකසනයේ මූලික අංග

- **පාලන ඒකකය**
  සියලු ම සැකසුම් සඳහා අවශ්‍ය වේ. වැඩසටහන්වල ඇති උපදෙස් අනුව සියලු ම ක්‍රියාවන් සහ සංරචක සම්බන්ධීකරණය කරයි.
- **අංකගණිත හා තාර්කික ඒකකය**
  පාලන ඒකකයේ උපදෙස් අනුව ක්‍රියාත්මක වේ. ගණිතමය මෙහෙයුම් (එකතු කිරීම, අඩු කිරීම, ගුණ කිරීම සහ බෙදීම) සහ තාර්කික මෙහෙයුම්(NOT, AND, OR) සිදු කරයි.
- **රෙජිස්තර** : අභ්‍යන්තර ආචයනයක් සපයයි ක්‍රියාවලට භාජනය වීමට නියමිත සහ භාජනයවූ තොරතුරු තාවකාලික ව ගබඩා කරයි. අංකගණිත හා තාර්කික ඒකකයට අදාළ උපදෙස් ද මෙහි තාවකාලික ව ගබඩා කරයි

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

වොන් නියුමාන් නිර්මිතිය (Von Neumann architecture)



- **Bus :**පරිගණකයේ කොටස් අතර දත්ත, යොමු සහ පාලන සංඥා ගමන් කිරීම සඳහා ඇති සම්ප්‍රේෂණ මාර්ගය මෙනමින් හැඳින්වේ.

දත්ත සහ තොරතුරු

දත්ත යනු කුමක් ද?

පරිගණකය හෝ මිනිසා හෝ විසින් කිසියම් ක්‍රියාවක් සඳහා යොදා ගනු ලබන ප්‍රමාණයන්, අනුලක්ෂණ හා සලකුණු වැනි මූලික කරුණු හැඳින්වීම සඳහා දත්ත යන වචනය යොදා ගැනේ. පරිගණකය තුළ මෙම දත්ත විද්‍යුත් සංඥා ලෙස සම්ප්‍රේෂණය වන අතර ආචයන මාධ්‍යයන්හි ගබඩා කෙරේ.

දත්ත, අක්ෂර (අ - ඉ, **A-Z, a-z etc.**), ඉලක්කම්**(0-9)**, වෙනත් සංකේත**(+, -, *, <, > etc.)** සහ/හෝ වර්ණ ආදී ඕනෑ ම මූලික දෙයකින් නිරූපණය කළ හැකි ය.

තොරතුරු යනු මොනවාද?

තොරතුරු යනු පරිශීලකට කිසියම් අර්ථයක් ලබා දෙන්නා වූ, සංවිධානය වූ නැතහොත් සකස් කරන ලද දත්ත වේ. තොරතුරු මඟින් පරිශීලකට කිසියම් දෙයක් පිළිබඳ ව තීරණ ගැනීමට හැකියාවක් ලබා දේ.වඩ ත් අර්ථවත් වීම සඳහා, තොරතුරුවල පහත දැක්වෙන ගති ලක්ෂණ පැවතිය යුතු ය.

- **අදාළතාව:** තොරතුරු අදාළ පුද්ගලයා වෙත සම්ප්‍රේෂණය විය යුතු ය. ඒවා පරිශීලක අවශ්‍යතාවට අදාළ විය යුතු ය. එක් පරිශීලකයකුට එක් අවශ්‍යතාවක් සඳහා අදාළ වන තොරතුරු වෙනත් පරිශීලකයකුට හෝ වෙනත් අවශ්‍යතාවකට හෝ අදාළ නොවිය හැකි ය.

AlevelApi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

- **නිරවද්‍ය බව :** තොරතුරු සාධාරණවිය යුතු මෙන් ම පක්ෂග්‍රාහී නොවිය යුතු ය. මොන යම් ආකාරයේ හෝ වැරදිවලින් තොර විය යුතු ය. සෘජුලිඛිත තොරතුරු, වක්‍ර වාචික තොරතුරුවලට වඩා විශ්වාසදායක ය.
- **පරිපූර්ණත්වය :** නිරවද්‍යතාව මෙන් ම තොරතුරු පූර්ණත්වයෙන් තිබිය යුතු ය. ඒවායේ කරුණු සඟවා හෝ අස්ථානගත වී හෝ නොතිබිය යුතු ය. පූර්ණත්වයක් නොමැති සත්‍ය තොරතුරුවල ප්‍රයෝජනය අඩු ය.
- **කාලීන බව :** ලැබෙන තොරතුරු මත පදනම් ව නිවැරදි තීරණ ගැනීමට ප්‍රමාණවත් කාලයක් සහිත ව තොරතුරු ලැබිය යුතු ය. නවතම තොරතුරුවලට වඩා, යල් පැන ගිය තොරතුරුවල වටිනාකම අඩු වේ. පුවත් පතකින් ලැබෙන තොරතුරුවලට වඩා රූපවාහිනිය මඟින් ලැබෙන තොරතුරුවල වටිනාකම වැඩි ය. කාලීන බව ද අවස්ථානුකූල ව වෙනස් වේ. මෙහි දී වඩාත් වැදගත් වන්නේ සන්නිවේදන මාධ්‍යය තෝරා ගැනීමේ හැකියාව යි.
- **විශ්වසනීයත්වය :** වලංගු සහ විශ්වසනීය ප්‍රභවයන්ගෙන් ලැබෙන තොරතුරුවල විශ්වාසනීයත්වය ඉහළය. එවන් තොරතුරු මත විශ්වසයක් තබා නිවැරදි තීරණ ගත හැකි ය. උදාහරණයක් ලෙස, ආයතනයක විකුණුම් අංශය මඟින් මූල්‍ය අංශය වෙත නිකුත් කරනු ලබන විකුණුම් වාර්තා එම ආයතනයේ අභ්‍යන්තරයෙන් ම ලැබෙන හෙයින් විශ්වසනීයත්වයෙන් ඉහළ ය.
- **ප්‍රවේශවීමේ හැකියාව :** තොරතුරුවලට අවශ්‍ය විටෙක පහසුවෙන් ළඟා වීමේ හැකියාවක් සහිත ව ගබඩා කොට තිබිය යුතු ය. ඉහත උදාහරණයෙහි, මූල්‍ය ලේඛනයක අඩංගු නවතම විකුණුම් තොරතුරු අවශ්‍ය විටෙක මුද්‍රණය කර ගත හැකි විය යුතු ය. ඒ සඳහා පෑ ගණනාවක් ගත වන්නේ නම් ඒ සඳහා ප්‍රවේශ වීමේ හැකියාව අඩු ය. එනම්, පරිශීලකට අවශ්‍ය අවස්ථාවක දී අදාළ තොරතුරුවලට ප්‍රවේශ වීමේ හැකියාවක් ඇත.

පුද්ගල පරිගණක පිරිවිතර

පිරිවිතර යනු මොනවා ද?

පිරිවිතර(spec) යනු, යමකුට තමාගේ, ඔහුගේ අවශ්‍යතා සපුරාලන අන්දමේ පරිගණකයක් මිල දී ගැනීමට උපකාර වීම සඳහා වෙළෙන්දා විසින් සපයනු ලබන, පරිගණකයේ මූලික සංරචකවල ගුණාංග හෝ හැකියා හෝ පිළිබඳ ලැයිස්තුවකි. එනම්, පරිගණකයේ පිරිවිතර සලකා බැලීමේ දී, තමන්ගේ අවශ්‍යතාව පිළිබඳ ව හොඳින් අවබෝධ කොට ගත යුතු ය.

පරිගණකයක පිරිවිතර සලකා බැලීමේ දී පහත දැක්වෙන සංරචක වඩාත් වැදගත් ස්ථානයක් ගනී

- සකසනයේ ස්පන්ධ වේගය
- ප්‍රධාන මතකයේ ධාරිතාව සහ ස්පන්ධ වේගය
- දෘඪ තැටියේ ධාරිතාව සහ වේගය
- මොනිටරයේ වර්ගය, ප්‍රමාණය සහ විභේදනය
- මවු පුවරුව - සම්බන්ධ නිර්ණායක හා ගැළපිය යුතු ය **(Wi-Fi, RJ45, USB, ...ආදී)**

මෙහෙයුම් පද්ධතිය (OS)

AlevelApi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

පරිගණකයක් සාමාන්‍යයෙන් කලින් ස්ථාපනය කරන ලද කුමන හෝ මෙහෙයුම් පද්ධතියක් සමඟ මිලදී ගත හැකි ය. ඔබ මෙහෙයුම් පද්ධතියක් පමණක් මිල දී ගන්නේ නම්, දැනට භාවිත කරන මෘදුකාංග, එම මෙහෙයුම් පද්ධතිය සමඟ ක්‍රියාත්මක කළ හැකි දැයි සොයා බැලීම වැදගත් වේ. දැනට ඇති පරිගණක සමඟ ඉදිරියේ දී මිලදී ගනු ලබන යන්ත්‍ර එක් ව ක්‍රියාත්මක වීමට මෙය වැදගත් වේ.

සමහර මෙහෙයුම් පද්ධති හිමිකම් සහිත ව මිලදී ගත යුතු වන අතර, අනෙක්වා නොමිලයේ ලබා ගත හැකි ය.

මිලදී ගැනීමේදී සැලකිලිමත් විය යුතු කරුණු

පරිගණකයක් මිල දී ගැනීමේ දී පහත කරුණු පිළිබඳ ව සැලකිලිමත් විය යුතු ය.

- පරිගණකය මිල දී ගැනීමේ අරමුණු සහ තෝරා ගන්නා ලද පිරිවිතර මඟින් එම අවශ්‍යතා සපුරා ගන්නේ ද යන බව
- තාක්ෂණික සේවාවන්ගෙන් ලැබෙන සහයෝගය පිළිබඳ ව සෑහීමකට පත් වන්නේ ද යන බව
- වගකීම (සම්පූර්ණ, සීමිත, ස්ථානීය,වසර ගණන ආදි වශයෙන්)

යෙදුම් මෘදුකාංග

යෙදුම් මෘදුකාංග මිලදී ගැනීමේ දී ඒවා පරිගණකයේ දෘඪාංග සහ මෙහෙයුම් පද්ධතිය සමඟ ගැළපෙන ඒවා විය යුතු ය. පරිගණකයට අනවශ්‍ය පරිදි නිදහස් මෘදුකාංග ස්ථාපනය නොකළ යුතු ය. එය පරිගණකයට හානිදායක විය හැකි ය.

ප්‍රති-වෛරස මෘදුකාංග

පරිගණකයට ප්‍රති-වෛරස මෘදුකාංග ස්ථාපනය කළ යුතු අතර එය නිරන්තරයෙන් යාවත්කාලීන කළ යුතු ය. එමෙන් ම නිරන්තරයෙන් පරිගණකය පරීක්ෂා කළ යුතු ය. නිදහස් හෝ මුදල් ගෙවා දායක වන හෝ ප්‍රතිවෛරස පැකේජයක් ස්ථාපනය කළ හැකි ය.

ප්‍රති වෛරස මෘදුකාංග එකකට වැඩි සංඛ්‍යාවක් එක් පරිගණකයකට ස්ථාපනය නොකළ යුතු ය.

ප්‍රති-අනිෂ්ට මෘදුකාංගයක් **(anti-malware)**, ප්‍රති-චරපුරුෂ මෘදුකාංගයක් **(anti-spyware)** හෝ ආරක්ෂක කට්ටලයක් **(security suite)** හෝ මඟින් ද ප්‍රති-වෛරස මෘදුකාංගයකට සමාන කාර්යයක් ඉටු කරන බැවින් ඒවා ද නිර්දේශ කරනු ලැබේ. අමතර ආරක්ෂාවක් සඳහා පරිගණකයේ ගිනි පවුර සක්‍රිය ව තබන්න.

AlevelApi.com උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බෝහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

නිපුණතාව 2 : පරිගණකය තුළ දත්ත නිරූපණය ගවේෂණය කරයි

නිපුණතා මට්ටම 2.1 : පරිගණක පද්ධතිවල දත්ත නිරූපනය සහ ඒ හා බැඳුනු මූලික සංකල්ප විස්තර කරයි

කාලච්ඡේද සංඛ්‍යාව : **03**

ඉගෙනුම් පල :

- පාද අගය, ස්ථානීය අගය සහ භාරය ඇසුරින් සංඛ්‍යා පද්ධති විස්තර කරයි
- දශමය සංඛ්‍යා ද්විම සංඛ්‍යා බවට පරිවර්තනය කරයි
- ද්විම සංඛ්‍යා දශමය සංඛ්‍යා බවට පරිවර්තනය කරයි

විෂය අන්තර්ගතය :

- සංඛ්‍යා පද්ධති
  - දශමය
  - ද්විම
  - සොළොස් දශමය
- යෝග්‍ය පරිවර්තන ක්‍රම (ධන නිඛිල සංඛ්‍යා පමණ යි)
  - දශමය සංඛ්‍යා ද්විම සංඛ්‍යා බවට
  - ද්විම සංඛ්‍යා දශමය සංඛ්‍යා බවට

මූලික වදන්/සංකල්ප :

- දශමය, ද්විම හා ෂඩ් දශමය සංඛ්‍යා පද්ධතිවල පාදය, ස්ථානීය අගය හා භාරය **(Weight)**
- ධන නිඛිල පමණක් අවධාරණය කිරීම
- මෙම සංඛ්‍යා පද්ධතිවල භාවිතයන්ට උදාහරණ හේතු සහිත ව ලබා දීම **(RGB, hexadecimal)**
- දශමය සංඛ්‍යා ද්විම සංඛ්‍යා බවට පරිවර්තනය හා ප්‍රතිවර්තය

පාඩම් සැලසුම් සඳහා උපදෙස් :

- දශමය, ද්විම, අෂ්ටම හා ෂඩ් දශමය සංඛ්‍යා පද්ධතිවල පාද අගය, ස්ථානීය අගය හා භාරය**(Weight)** පිළිබඳ ව සාකච්ඡාවක් මෙහෙයවීම
- පරිවර්තන කරන ආකාරය පෙන්වාදීම **(ප්‍රදර්ශනය කිරීම)**

ගුණාත්මක යෙදවුම් :

- අන්තර්ජාල සම්බන්ධතාව සහිත පරිගණක, ගණක රාමුවක ආකෘතියක්

ඇගයීම් සහ තක්සේරුකරණය සඳහා උපදෙස් :

- පාද අගය, ස්ථානීය අගය හා භාරය**(Weight)** හඳුනා ගැනීම සඳහා අභ්‍යාස කරවීම
- අදාළ පරිවර්තන සහිත අභ්‍යාස කරවීම

AlevelApi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බෝහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

නිපුණතා මට්ටම 02.2 : මූලික බූලීය කාරක හඳුනා ගනියි

කාලපේද සංඛ්‍යාව : 01

ඉගෙනුම් ඵල

- මූලික බූලීය කාරක සඳහා සත්‍යතා වගු අඳී
- දෙන ලද බූලීය ප්‍රකාශ සඳහා සත්‍යතා වගු අඳී

විෂය අන්තර්ගතය :

- මූලික බූලීය කාරක
    - **AND**
    - **OR**
    - **NOT**

මූලික වදන්/සංකල්ප

- මූලික බූලීය කාරක සහ අදාළ සත්‍යතා වගු
- ආදාන දෙකක් පමණක් යොදා ගන්න

පාඩම් සැලසුම් සඳහා උපදෙස්

- එදිනෙදා හමු වන උදාහරණ ඇසුරින් මූලික බූලීය කාරක සංකල්පය පැහැදිලි කිරීම

ගුණාත්මක යෙදවුම් :

- අන්තර්ජාල සම්බන්ධය සහිත පරිගණක
- http://ryanstutorials.net/boolean-algebra-tutorial/boolean-algebra.php

ඇගයීම් සහ තක්සේරුකරණය සඳහා උපදෙස් :

- දෙන ලද මූලික බූලීය කාරක සඳහා සත්‍යතා වගු ඇඳීම
- මූලික බූලීය කාරක සම්බන්ධ අභ්‍යාස කරවීම

AlevelApi.com උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

නිපුණතා මට්ටම 2.3 : විවිධ අනුලක්ෂණ නිරූපණය සහ ඒවායේ භාවිතය විස්තර කරයි

කාලච්ඡේද සංඛ්‍යාව : 01

ඉගෙනුම් පල

- පරිගණක තුළ, ආකේතන පද්ධතිවල අවශ්‍යතාව කෙටියෙන් විස්තර කරයි
- ඇස්කි සහ යුනිකේත ආකේතන පද්ධති සංසන්දනය කොට පහදයි

විෂය අන්තර්ගතය

- පරිගණක තුළ ආකේතන පද්ධති භාවිතය
  - ASCII
  - UNICODE

මූලික වදන්/සංකල්ප

- ආකේතන පද්ධතිවල අවශ්‍යතාව
- ඇස්කි සහ යුනිකේත ආකේතන පද්ධතිවල භාවිතය

පාඩම් සැලසුම් සඳහා උපදෙස්

- වදන් සැකසුමක් යොදා ගෙන ඇස්කි කේතය පැහැදිලි කරන්න (උදා. **type 65 with Alter key for letter "A")**
- යුනිකේත ආකේතන ක්‍රමය පැහැදිලි කොට, සිංහල හෝ දෙමළ හෝ යුනිකේත මඟින් සම්මත සංකේත විස්තෘත කර ඇති අන්දම පෙන්වන්න

ගුණාත්මක යෙදවුම්

- සිංහල/දෙමළ භාෂා කට්ටලය ස්ථාපනය කරන ලද පරිගණක
- සිංහල/දෙමළ ලේඛන

ඇගයීම් සහ තක්සේරුකරණය සඳහා උපදෙස්

- දෙන ලද වචන ඇස්කි කේතවලට පරිවර්තනය කරවන්න
- යුනිකේත භාවිතයෙන් සිංහල හෝ දෙමළ හෝ අකුරු යතුරුලියනය කරවන්න

AlevelApi.com උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බෝහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

කියවීම් ද්‍රව්‍ය :

සංඛ්‍යා පද්ධති : සංඛ්‍යා නිරූපණය සහ නම් කිරීම සඳහා සකස් කරන ලද පද්ධතියක් සංඛ්‍යා පද්ධතියක් ලෙස හැඳින්වේ. සංඛ්‍යා පද්ධතියක මූලික අරමුණ අපගේ ගණනය කිරීම් හා සම්බන්ධ ව නිශ්චිත ඉලක්කම් (සංකේත) සංඛ්‍යාවක් සහ, ඒ අනුසාරයෙන් කවර හෝ සංඛ්‍යාවක් නිරූපණය කිරීම සඳහා නිශ්චිත රටාවක් සැපයීම යි.

පරිගණකය හා සම්බන්ධ සංඛ්‍යා පද්ධති සමහරක් නම් :

- දශමය
- ද්විමය
- ෂඩ් දශමය

සංඛ්‍යා පද්ධතිවල සංකේත

සංඛ්‍යාපද්ධතිය	පාදඅගය	සංකේතසංඛ්‍යාව	සංකේත
දශමය	10	10	0,1,2,3,4,5,6,7,8,9
ද්විමය	2	2	0,1
ෂඩ්දශමය	16	16	0,1,2,3,4,5,6,7,8,9,A,B,C,D,E,F


- සංඛ්‍යා පද්ධතියක පාද අගයට සමාන සංකේත සංඛ්‍යාවක් එම සංඛ්‍යා පද්ධතියට අඩංගු වේ.

ස්ථානීය අගය :


කිසියම් සංඛ්‍යා පද්ධතියක ස්ථානය හා සම්බන්ධ අගයයෝ එම සංඛ්‍යා පද්ධතියේ ස්ථානීය අගය මඟින් නිරූපනය වෙති

උදා:

2 4 3 2 යන සංඛ්‍යාවේ **3** සංඛ්‍යාංකය පිහිටා ඇත්තේ දහය ස්ථානයේ වන අතර **4** සංඛ්‍යාංකය පිහිටා ඇත්තේ සියය ස්ථානයේ ය. එබැවින් **3** මඟින් **3x10 = 30** ද **4** මඟින් **4x 100 = 400**ද නිරූපණය වේ.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...



ද්විම සංඛ්‍යා පද්ධතිය

දෙකේ පාදයේ සංඛ්‍යා පද්ධතියේ ස්ථානීය අගයයෝ අවම වෙසෙසි බිටුවේ සිට දෙකෙහි බල ආකාරයෙන් වෙනස් වෙති.

උදා : ද්විම 11101හි :

සංඛ්‍යාව	**1**	**1**	**1**	**0**	**1**
ස්ථානීය අගය	**2^4**	**2^3**	**2^2**	**2^1**	**2^0**
	16	**8**	**4**	**2**	**1**

ෂඩ් දශමය සංඛ්‍යා පද්ධතිය

ෂඩ් දශමය සංඛ්‍යා පද්ධතියේ ස්ථානීය අගයයෝ අවම වෙසෙසි සංඛ්‍යාංකයේ සිට දහසයෙහි බල ආකාරයෙන් වෙනස් වෙති.

උදා : ෂඩ් දශමය 3B2C හි :

සංඛ්‍යාව	**3**	**B**	**2**	**C**
ස්ථානීය අගය	**16^3**	**16^2**	**16^1**	**16^0**
	4096	**256**	**16**	**1**

AlevelApi.com උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...


ඒ

සංඛ්‍යා පරිවර්තනය

දශමය සංඛ්‍යා ද්විමය සංඛ්‍යා බවට


දශමය 25 ද්විමය බවට හරවන්න

භාජක	භාජ්‍යය	ඉතිරිය



ද්විම සංඛ්‍යා දශමය සංඛ්‍යා බවට

උදා : 11011_2



පිළිතුර $\underline{11011_2=27}$

AlevelApi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

මූලික බූලීය කාරක

- AND
- OR
- NOT

AND කාරකය

තාර්කික ඒකාබද්ධතාව(conjunction) නිරූපණය සඳහා යොදා ගැනේ

ආදාන		ප්‍රතිදානය(ප්‍රතිඵලය)
A	**B**	**(A AND B) /(A.B)**
0	**0**	**0**
0	**1**	**0**
1	**0**	**0**
1	**1**	**1**

OR කාරකය

බූලීය ප්‍රකාශ දෙකක විසම්බන්ධය (disjunction) නිරූපණය කිරීමට යොදා ගැනේ

ආදාන		ප්‍රතිදානය(ප්‍රතිඵලය)
A	**B**	**(A OR B) /(A+B)**
0	**0**	**0**
0	**1**	**1**
1	**0**	**1**
1	**1**	**1**

AlevelApi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

NOT කාරකය

තාර්කික නිෂේධනය (negation) නිරූපණය සඳහා යොදා ගැනේ

ආදාන	ප්‍රතිදානය
A	**(A)'**
0	**1**
1	**0**

දෙන ලද බූලීය ප්‍රකාශ සඳහා සත්‍යතා වගු

උදා : **F = (A+B)•(A' •B)+(A+B)'**

A සහ **B**විචල්‍යයන් ආදාන සහ **F** විචල්‍යය ප්‍රතිදානය ලෙස උපකල්පනය කරන්න

Inputs		**Intermediate combinations**					**Final Output (F)**
A	**B**	**A'**	**(A'.B)**	**(A+B)**	**(A+B)'**	**(A'.B)+(A+B)'**	**(A+B).(A'.B)+(A+B)'**
0	**0**	**1**	**0**	**0**	**1**	**1**	**0**
0	1	1	1	1	0	1	1
1	0	0	0	1	0	0	0
1	1	0	0	1	0	0	0

පරිගණකය තුළ ආකේතන පද්ධතිවල අවශ්‍යතාව

- පරිගණක පද්ධතියක් තුළ අකුරු, ඉලක්කම්, චිත්‍රක, ශබ්ද, වීඩියෝ ඇතුළු සියලු ම අනුලක්ෂණ නිරූපනය කරන කුඩා ම ඒකකය බිටුව වේ.
- බිටුවක් 1 හෝ **0** හෝ මඟින් නිරූපණය කෙරේ. (කිසියම් වෝල්ටීය මට්ටමක් 1 ලෙස ද, ඊට අඩු වෝල්ටීය අගයක් **0** ලෙස ද සැලකේ)
- එක් බිටුවක් මඟින් වෙනස් අනුලක්ෂණ 2ක් පමණක් නිරූපණය කළ හැකි ය

AlevelApi.com උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

- මේ අනුව'n'බිටු සංඛ්‍යාවකින්2^nඅනන්‍ය බිටු සංකලනයක්හෙවත් අනුලක්ෂණ 2^nසංඛ්‍යාවක්නිරූපනය කළ හැකි ය
- මේ අනුව බිටු **8**ක් වන තෙක් සංඛ්‍යාවකින් පහත ආකාරයේ සංකලනයන් නිර්මාණය කළ හැකි ය

ASCII ආකේතන පද්ධතිය

- ASCII යනු බිටු **8**කින් සමන්විත ආකේතන පද්ධතියකි
- සෑම යතුරුපුවරු අනුලක්ෂණයක් සඳහා ම අනන්‍ය කේතයක් ඇත
- A අක්ෂරය සඳහා වන **ASCII කේතය** - 01000001

ඒකකේත(UNICODE)

- **ASCII** ආකේතන පද්ධතිය මඟින් අනන්‍ය අනුලක්ෂණ **256**ක් පමණක් නිරූපණය සළ හැකි හෙයින් වඩා විශාල අනුලක්ෂණ සංඛ්‍යාවක් නිරූපණය කිරීමට එය යොදාගත නොහැකි ය. එබැවින්, විවිධ අන්තර්ජාතික භාෂාවන්ගේ අක්ෂර නිරූපණය කිරීම සඳහා වඩාත් විශාල බිටු සංඛ්‍යාවකින් යුත් ආකේතන පද්ධතියක් අවශ්‍ය වේ.
- ඒකකේත ආකේතන පද්ධතිය බිටු **16**කින් සමන්විත වන හෙයින් 2^{16}හෙවත් අනුලක්ෂණ **65536**ක් තෙක් නිරූපණය කිරීමට හැකියාවක් එයට ඇත
- අ- සඳහා ඒකකේත බිටු සංකලනය - 0000 1101 1000 0101
- அ- සඳහා ඒකකේත බිටු සංකලනය - 0101 1000 1011 0000

AlevelApi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

නිපුණතාවය 3 : මෙහෙයුම් පද්ධති පිළිබඳ අවබෝධය මඟින් පරිගණකයකාර්යක්ෂම හා ඵලදායී අයුරින් භාවිත කරයි

නිපුණතා මට්ටම 3.1 : පරිගණකයේ ක්‍රියාකාරීත්වය උදෙසාමෙහෙයුම් පද්ධතියක දායකත්වය ගවේෂණය කරයි

කාලච්ඡේද සංඛ්‍යාව : 01

ඉගෙනුම් ඵල :

- පරිගණකය තුළ මෙහෙයුම් පද්ධතියේ භාවිතය සංක්ෂිප්ත ව පැහැදිලි කරයි
- මෙහෙයුම් පද්ධතියක මූලික කාර්යයන් ලැයිස්තු ගත කරයි
- මෙහෙයුම් පද්ධති මඟින් ලබා දෙන අතුරු මුහුණත් වර්ග දෙක වෙන් කොට හඳුනා ගනීවිධාන රේඛා අතුරුමුහුණත/චිත්‍රක පරිශීලක අතුරුමුහුණත(CLI/GUI)

විෂය අන්තර්ගතය :

- මෙහෙයුම් පද්ධතියක හැඳින්වීම
- මෙහෙයුම් පද්ධතියක මූලික කාර්ය

මූලික වදන් හා සංකල්ප :

- පුද්ගල පරිගණක මෙහෙයුම් පද්ධතිසඳහා උදාහරණ
- මෙහෙයුම් පද්ධතියක කාර්ය භාරය

පාඩම් සැපසුම් සඳහා උපදෙස් :

- චිත්‍රක පරිශීලක අතුරු මුහුණත සහ විධාන පේළි අතුරු මුහුණත ප්‍රදර්ශනය කිරීම
  මෙහෙයුම් පද්ධතියක කාර්ය භාරය පිළිබඳ ව සංක්ෂිප්ත සාකච්ඡාවක් මෙහෙයවීම

ගුණාත්මක යෙදවුම් :

- අන්තර්ජාල සම්බන්ධතාව සහිත පරිගණක, මෙහෙයුම් පද්ධති අඩංගු තැටි (CDs/DVDs)

ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- මෙහෙයුම් පද්ධති වර්ග සහ ඒවායේ කාර්ය භාරය ඇසුරින් ව්‍යුහගත ප්‍රශ්න ලබා දීම

AlevelApi.com උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

නිපුණතා මට්ටම 3.2 : මෙහෙයුම් පද්ධතිවල කාර්ය භාවිතයට ගනී

කාලච්ඡේද සංඛ්‍යාව : 02

ඉගෙනුම් ඵල

- සුදුසු නමක් සහිත ව ගොනු සහ ගොනු බහලු නිර්මාණය කරයි
- ගොනුවල දිගු අනුව, ගොනු වර්ග වෙන් කොට හඳුනා ගනී
- පවතින ගොනු සහ ගොනු බහලු සඳහා පහත මෙහෙයුම් ආදර්ශනය කරයි
  - නම් වෙනස් කිරීම
  - කොපි කිරීම
  - විතැන් කිරීම
  - මැකීම
- පාලන මඩුල්ලේ පිහිටුවීම් **(Control panelsettings)** අවශ්‍ය පරිදි සකස් කරයි
- අදාළ කාර්යයන් ඉටු කිරීම සඳහා, මෙහෙයුම් පද්ධතියට අයත් මෙවලම් කිහිපයක් හඳුනා ගෙන, සුදුසු පරිදි යොදා ගනී

විෂය අන්තර්ගතය :

- ගොනු සහ ගොනු බහලු කළමනාකරණය (සෑදීම, නම් කිරීම, නම වෙනස් කිරීම, මැකීම, කොපි කිරීම හා විතැන් කිරීම)
- ගොනු නාම සහ දිගු
- පාලන මඩුල්ල තුළ සකස් කිරීම්
  - උපස්ථ කිරීම
  - අක්ෂර
  - මූසිකයේ සැකසුම්
  - දිනය, වේලාව සහ ප්‍රදේශීය හා භාෂාපිහිටුවීම් **(Regional and Language Settings)**
  - වැඩසටහන් එකතු කිරීම සහ ඉවත් කිරීම
  - පරිශීලක ගිණුම්
- මෙහෙයුම් පද්ධතියට අයත් මෙවලම්
  - තැටි පරීක්ෂා කිරීම
  - අනුලක්ෂණ සිතියම
  - තැටි ප්‍රතිඛණ්ඩනය
  - තැටි පිරිසිදු කිරීම

මූලික වදන් සහ සංකල්ප

- ගොනු සහ ගොනු බහලු නිර්මාණය, නම් වෙනස් කිරීම, මැකීම,විතැන් කිරීම

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

- පාලන මඩුල්ලේ සැකසුම්: උස්තරණය, අක්ෂර, මූසික සැකසුම්, දිනය සහ වේලාව, භාෂා සහ ප්‍රදේශ සැකසුම්, වැඩසටහන් ඉවත් කිරීම, පරිශීලක ගිණුම්,
- මෙහෙයුම් පද්ධතියක මෙවලම් භාවිතය: අනුලක්ෂණ සිතියම, තැටි ප්‍රශස්තකරණය, තැටි පරීක්ෂාව සහ තැටි පිරිසිදු කිරීම

පාඩම් සැලසුම් සඳහා උපදෙස් :

- ගොනු සහ ගොනු බහලු කළමනාකරණය සඳහා අදාළවන ක්‍රියාකාරකම් අඩංගු වැඩපතක් සැපයීම
- පාලන මඩුල්ලේ සැකසුම්වලට අදාළ ව වැඩපතක් සැපයීම
- මෙහෙයුම් පද්ධති මෙවලම් ප්‍රදර්ශනය කරමින් සාකච්ඡාවක් මෙහෙයවීම

ගුණාත්මක යෙදවුම්

- පරිගණක
- බහුමාධ්‍ය ප්‍රක්ෂේපණයක්

ඇගයීම් සහ තක්සේරුකරය සඳහා උපදෙස් :

- ගොනු සහ ගොනු බහලුවල සැකසුම් වලට අදාළව ප්‍රායෝගික ඇගයීමක් ලබා දීම
- බහුවරණ ප්‍රශ්න ලබා දීම

AlevelApi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බෝහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

කියවීම් ද්‍රව්‍ය

පද්ධති මෘදුකාංග

පද්ධති මෘදුකාංග, පහත දැක්වෙන අංගවලින් සමන්විත වැඩසටහන්වල එකතුවකි

- මෙහෙයුම් පද්ධති
- උපයෝගීතා මෘදුකාංග
- උපාංග ධාවක

මෙහෙයුම් පද්ධති හැඳින්වීම

- පරිගණකයේ සම්පත් කළමනාකරණය, පරිශීලක හා පරිශීලක වැඩසටහන්වලට පරිගණකය සමඟ අන්තර්ක්‍රියා කිරීම සඳහා අතුරුමුහුණතක් ලබාදීම සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- පරිගණකය භාවිතයට අදාළ තාක්ෂණික තොරතුරු පරිශීලකගෙන් සඟවා තබා ගෙන හැසිරවීම
- මෙහෙයුම් පද්ධතියකින් තොර ව පරිගණකයක් ක්‍රියාත්මක කළ නොහැකි ය. එනම් පරිගණකයක් ඵලදායී වීමට නම් මෙහෙයුම් පද්ධතියක් අත්‍යවශ්‍ය ය
- සමහර උපයෝගීතා වැඩසටහන් මෙහෙයුම් පද්ධතියත් සමඟ ලබාදේ

මෙහෙයුම් පද්ධතියක මූලික කාර්ය

සෑම පරිගණකයකට ම මෙහෙයුම් පද්ධතියක් තිබීම අත්‍යවශ්‍ය වන අතර එමඟින් පරිගණකය තුළ විවිධ ක්‍රියාකාරකම් සිදු කරයි

1. **සම්පත් කළමනාකරණය :** පරිගණක මතකය, සකසන කාලය, ආචයනය, සහ මුද්‍රකය හා මොනිටරය වැනි ආදාන/ප්‍රතිදාන උපාංග ඇතුළු පරිගණකයේ සියලු ම සම්පත් කළමනාකරණය සිදු කරයි

2.**පරිශීලක අතුරුමුහුණත ලබා දීම :** අතුරුමුහුණත හරහා පරිශීලකට යෙදුම් මෘදුකාංග සහ දෘඩාංග සමඟ අන්තර්ක්‍රියා කිරීමේ ඉඩකඩ ලබාදේ

අතුරුමුහුණත් ආකාර දෙකකි,

1 **විධාන රේඛා අතුරුමුහුණත(Command Line Interface - CLI):** පරිගණකය සමඟ සන්නිවේදනය කිරීම සඳහා විධාන රාශියක් යොදා ගැනේ.

2 **චිත්‍රක පරිශීලක අතුරුමුහුණත(Graphical User Interface - GUI) :** අයිකන, කවුළු වැනි චිත්‍රක අංග යොදා ගනිමින් පරිගණකය සමඟ සන්නිවේදනය කරයි. ඊට අමතර ව, කටහඬ හඳුනා ගැනීම වැනි නවතම ලක්ෂණද නවීන මෙහෙයුම් පද්ධතිවල දක්නට ඇත. මෙමඟින් පරිශීලකට තම කටහඬ යොදා ගනිමින් පරිගණකය හා සන්නිවේදනය කිරීමේ පහසුකම් ලබාදේ.

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

මෙහෙයුම් පද්ධති වර්ග :

1. **තනි මෙහෙයුම් පද්ධති :** තනි පුද්ගල පරිගණකයක් **(Desktop or Laptop)** මෙහෙයවීම සඳහා යොදා ගැනේ. පරිගණකයේ දෘඪ තැටිය මත ගබඩා කොට තැබේ. පරිගණකය ජාලයකට සම්බන්ධ ව ඇති විට, මෙම මෙහෙයුම් පද්ධතිය මඟින් ජාලයේ ඇති සම්පත් බෙදා ගැනීම සහ කළමනාකරණය සඳහා පහසුකම් ලබා දේ.

2. **ජාල මෙහෙයුම් පද්ධති :** ජාලගත පරිගණක මෙහෙයවීම සහ පාලනය සඳහා යොදා ගැනේ. ජාලයට සම්බන්ධ වීම සහ ජාලය තුළ සම්පත් බෙදා ගනිමින් ක්‍රියා කිරීම සඳහා මෙම මෙහෙයුම් පද්ධතිවල සුවිශේෂ පහසුකම් සපයා ඇත. සාමාන්‍යයන් මෙම මෙහෙයුම් පද්ධතිය ජාලයේ එක් පරිගණකයක **(සේවා දායක හෙවත් සර්වර් පරිගණකයේ)** ගබඩා කොට ඇත. මෙම පරිගණකය මඟින් ජාලයේ සියලුම පරිගණක සම්බන්ධීකරණය කරනු ලබයි.

3. **නිහිත මෙහෙයුම් පද්ධති (Embedded OS) :**තත්කාලීන මෙහෙයුම් පද්ධති ලෙස ද හැඳින්වේ. කිසියම් උපකරණයකට කාවද්දා ඇත. සුහුරු අත්ඔරලෝසු **(Smart Watches)**, දූරකථන, වීඩියෝ ක්‍රීඩා වැනි කුඩා ඉලෙක්ට්‍රොනික උපාංග පාලනය සඳහා යොදා ගැනේ.

ගොනු සහ ගොනු බහලු කළමනාකරණය

- ගොනු : විවිධ වර්ගවල ගොනු පරිගණකය තුළ දක්නට ලැබේ
  උදා : වීඩියෝ, ශබ්ද, ලේඛන, ජායාරූප වැනි
- ගොනුවක් සාමාන්‍යයන් නමකින් සහ දිගුවකින් හැඳින්වේ.
- ගොනු බහලු : ගොනු සහ ගොනු බහලු සංවිධානය කිරීම සඳහා ගොනු බහලු සංචායක ලෙස ක්‍රියා කරයි
- සුලබ ගොනු හා බහලු මෙහෙයුම් :
  - සෑදීම
  - නම් කිරීම/ නම් වෙනස් කිරීම
  - මැකීම
  - කොපි කිරීම
  - විතැන් කිරීම

  ඉහත මෙහෙයුම් සිදු කරන ආකාරය මෙහෙයුම් පද්දතිය අනුව වෙනස් වේ.

ගොනු නම් සහ දිගු

- ගොනු නාමය සහ දිගුව තිතකින් වෙන් වේ. ගොනු නම පරිශීලක විසින් සපයනු ලැබේ.
- ගොනු දිගුව මඟින් ගොනුව සකස් කිරීමට යොදා ගන්නා ලද මෘදුකාංගය හැඳින්වේ. එනම් එම ගොනුව ආශ්‍රිත වැඩසටහන තීරණය කරයි.

AlevelApi.com උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

සැකසුම් මඬුල්ලේ (Setting Panel)වෙනස් කිරීම්

- මෙහෙයුම් පද්ධතියේ කේන්ද්‍රගත මෙහෙයුම් ප්‍රදේශය පාලන මඬුල්ල වේ. වින්ඩෝස් මෙහෙයුම් පද්ධතියේ මෙය **'Control Panel'** ලෙස හඳුන්වා ඇති අතර **Mac** මෙහෙයුම් පද්ධතියේ'System Preferences'ලෙස හඳුන්වා ඇත.

උදාහරණ : යතුරුපුවරුවේ සහ මූසිකයේ ක්‍රියාකාරිත්වයන්, පරිශීලක ගිණුම් හා මුරපද, ජාල සැකසුම්, දෘඪාංග හා මෘදුකාංග සැකසුම්, මෘදුකාංග හා දෘඪාංග ස්ථාපනය සහ ඉවත් කිරීමආදිය

මෙහෙයුම් පද්ධතියේ මෙවලම්

- පහත දැක්වෙන උපයෝගිතා මෘදුකාංග, මෙහෙයුම් පද්ධතියේ මෙවලම් ලෙස සැපයේ.

1. තැටි පිරිසිදු කිරීම : අනවශ්‍ය ගොනු හඳුනා ගැනීමේ සහ ඉවත් කිරීමේ (වැරදි සොයා නිවැරදි කිරීමේ) මෙවලමකි. තැටියේ ඉඩ නිදහස් කර පද්ධතියේ කාර්යක්ෂමතාව වැඩි කරයි.
   උදා : වින්ඩෝස් මෙහෙයුම් පද්ධතියේ **'Disk Cleanup'**
2. තැටි ප්‍රශස්ත කරණය : බණ්ඩනය වූ කොටස් නැවත සකසා, තැටියේ ඉඩ සකස් කොට දෙයි. මෙමඟින් වඩා විශාල ගොනු ගබඩා කිරීමට හැකියාව ලබා දේ.
   උදා: වින්ඩෝස් මෙහෙයුම් පද්ධතියේ **'Disk Defragmentation'**
3. තැටි පරීක්ෂා කිරීම : තැටියේ කාණ්ඩවල ඒකාග්‍රතාව සුරක්ෂිත කොට තාර්කික ගොනු පද්ධති වැරදි සකසයි.
   උදා: වින්ඩෝස් මෙහෙයුම් පද්ධතියේ **'Check disk'**
   යුනික්ස් මෙහෙයුම් පද්ධතියේ **'fsck'**
4. අණුලක්ෂණ සිතියම : යෙදුම් සඳහා අවශ්‍යවන, අක්ෂරවලට අදාළ අණුලක්ෂණ ලබා ගැනීමට යොදා ගැනේ.
   උදා : වින්ඩෝස් මෙහෙයුම් පද්ධතියේ **'Character Map'**
   යුනික්ස් මෙහෙයුම් පද්ධතියේ **'fsymbols'**

AlevelApi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බෝනස් දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

නිපුණතාවය 04 : පරිගණකය ආශ්‍රිත චිඳිනෙදා කටයුතු සඳහා යෙදුම් මෘදුකාංග යොදා ගනී

නිපුණතා මට්ටම 04.1 : චිඳිනෙදා ලේඛන කටයුතු සඳහා වදන් සැකසුම් මෘදුකාංග යොදා ගනී

කාලච්ඡේද සංඛ්‍යාව : 06

ඉගෙනුම් පල :

- වදන් සැකසුම් මෘදුකාංගයක් කෙටියෙන් පැහැදිලි කරයි
- වදන් සැකසුම් මෘදුකාංගවල භාවිතය කෙටියෙන් පැහැදිලි කරයි
- වදන් සැකසුම් මෘදුකාංගවල සහලක්ෂණ සාකච්ඡා කරයි
- වදන් සැකසුම් මෘදුකාංගයක චිත්‍රක පරිශීලක අතුරුමුහුණතේ සංරචක ලැයිස්තු ගත කර හඳුනාගනී
- නව ලේඛනයක් නිර්මාණය කරයි
- නිවැරදි පාඨ ආකාර යොදා ගනී
- ඡේද ආකෘති කරණය භාවිත කරයි
- ලේඛනයක් අවශ්‍ය පරිදි ආකෘති කරණය කිරීමට ආකෘතිකරණ මෙවලම් යොදා ගනී
- ව්‍යාකරණ හා අක්ෂර වින්‍යාස මෙවලම් භාවිත කරයි
- අදාළ මෙවලම් භාවිතයෙන් රූපමය දෑ ඇතුළත් කොට සංස්කරණය කරයි
- සමීකරණ, සලකුණු, දිනය හා වේලාව ආදිය ඇතුළත් කරයි
- නව පිටුවක්, නව ඡේදයක් ලබා ගනී
- අවශ්‍ය පරිදි කෙටි මං යතුරු භාවිත කරයි
- අවශ්‍ය ක්‍රමයක් යොදා ගනිමින් වගු නිර්මාණය කොට අවශ්‍ය පරිදි ආකෘතිකරණය කරයි
- නිර්මාණය කරන ලද වගුවකට පේළි හා තීර ඇතුළත් කරයි
- නිර්මාණය කරන ලද වගුවක ඇති අනවශ්‍ය පේළි හා තීර මකා දමයි
- වගුවක කොටු ඒකාබද්ධ කරයි, කොටස්වලට බෙදයි
- නිර්මාණය කරන ලද වගුවක ඇති පේළිවල උස හා තීරවල පළල අවශ්‍ය පරිදි වෙනස් කරයි
- අවශ්‍යතාව අනුව විවිධ ආකාරවලින් ලේඛනයක් සුරකියි
- මුද්‍රණය කිරීමට පෙර, ලේඛනය මුද්‍රණය වන ආකාරය පිළිබඳ පූර්වාදර්ශනයක් ලබා ගනී
- සකස් කරන ලද ලේඛනයක් අවශ්‍ය මුද්‍රණ සැකසුම් යොදා ගනිමින් මුද්‍රණය කරයි

විෂය අන්තර්ගතය :

- වදන් සැකසුම් මෘදුකාංග හැඳින්වීම
- වදන් සැකසුම් මෘදුකාංගවල සහලක්ෂණ
- වදන් සැකසුම් මෘදුකාංගයක චිත්‍රක පරිශීලක අතුරුමුහුණතේ සංරචක
  - මාතෘකා තීරුව(Title bar)
  - හැඩසවි මෙවලම් (Formatting tools)

AlevelApi.com උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

- සංස්කරණ මෙවලම් (Editing tools)
- පිටු සැකසුම් මෙවලම් (Page Setup Tools)
- පිරිසැලසුම් මෙවලම්(Design tools)
- අනුචලන පටි (Scroll Bars)
- දසුන් මෙවලම්(View tools)
- වගු මෙවලම්(Table tools)
- සංස්කරණ පෙදෙස (Editing area/Text area)
- කර්සරය සහ ඇතුළත් කිරීමේ ලක්ෂ්‍යය (Cursor and insertion point)
- තත්ත්ව පේලිය (Status Bar)

- නව ලේඛනයක් සකස් කිරීම
  - පිටු වින්‍යාසය සහ පිටු මායිම්
  - ශීර්ෂක, පාදක සහ පිටු අංක
  - අක්ෂර යතුරුලියනය කිරීම, අක්ෂර ආකෘතිකරණය
- ලේඛනයක් සංස්කරණය කිරීම
  - සෙවීම සහ ආදේශනය
  - ව්‍යාකරණ සහ අක්ෂර පරීක්ෂාව
  - කැපීම(තැන් මාරුව), කොපි කිරීම, ඇලවීම
- වස්තු ඇතුළත් කිරීම සහ අදාළ සංස්කරණ මෙවලම්
  - රූප, වගු, හැඩතල, පසුරු සිත්තම්, වදන් සිත්තම්, පාඨ කොටු ආදිය
- සමීකරණ, සංකේත, සම්බන්ධක, බිඳුම්, දිනය සහ වේලාව ආදිය ඇතුළත් කිරීම
- කෙටි මං යතුරු
  - විවෘත කිරීම, නව ගොනුවක් ආරම්භය, තැන්පත් කිරීම, සියල්ල තේරීම, කැපීම(තැන් මාරුව), කොපි කිරීම, ඇලවීම, ලොප් කිරීම, නැවත කිරීම, මුද්‍රණය ආදිය
- වගු ඇතුළත් කිරීම හා හැඩසවි ගැන්වීම
  - වගු ඇතුළත් කිරීමේ ක්‍රම
    - මූසිකය ඇසුරින් පේලි හා තීරු සංඛ්‍යා තේරීම, වගු ඇතුළත් කිරීම, වගු ඇඳීම
- වගු ආකෘතිකරණය
  - පේලි හා තීරු ඇතුළත් කිරීම හා මැකීම
  - කෝෂ බිඳීම (split) හා එකතු කිරීම (merge)
  - පේලි උස/තිරු පළල වෙනස් කිරීම
  - වගු මායිම් රේඛා
  - විලාස (styles)
- විවිධ ආකාරවලින් ගොනු සුරැකීම
- ලේඛන මුද්‍රණය
  - මුද්‍රණ පෙනුම
  - මුද්‍රණ පිහිටුවීම්
  - මුද්‍රණය

AlevelApi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

මූලික වදන්/සංකල්ප :

- වදන් සැකසුම් මෘදුකාංගයක අවශ්‍යතාව කෙරෙහි අවධානය යොමු කිරීම (ලේඛනයක් නිර්මාණය, සංස්කරණය, බෙදා ගැනීම, රූපසටහන් භාවිතය)
- වදන් සැකසුම් මෘදුකාංගයක් ආරම්භ කළ හැකි විවිධ ආකාර
- පරිශීලක අතුරු මුහුණත හඳුනා ගැනීම
- පිටු සැකසුම, සංස්කරණය, ඇතුළු කිරීම, ආකෘතිකරණය (පාඨ, ඡේද), වගු ක්‍රියාකාරකම්, ලේඛනය සුරැකීම, ලේඛනය මුද්‍රණය

පාඩම් සැලසුම් සඳහා උපදෙස් :

- වදන් සැකසුම් මෘදුකාංගයක අවශ්‍යතාව සහ එහි සංරචක සාකච්ඡා කරන්න
- වදන් සැකසුම් මෘදුකාංගයක් ආරම්භ කළ හැකි විවිධ ආකාර පෙන්වන්න
- වදන් සැකසුම් මෘදුකාංගයක පරිශීලක අතුරු මුහුණතේ කොටස් සාකච්ඡා කරන්න
- පිටු ආකෘතිකරණය, සංස්කරණය, ඇතුළු කිරීම, ආකෘතිකරණය(පාඨ, ඡේද), වගු ක්‍රියාකාරකම්, ලේඛන සුරැකීම, ලේඛන මුද්‍රණය යන මෙවලම්වල ක්‍රියාවන් ප්‍රදර්ශනය කරන්න
- ඉහත ක්‍රියාකාරකම් අඩංගු වන පරිදි වෙන වෙනම වැඩපත් සපයන්න

ගුණාත්මක යෙදවුම් :

- වදන් සැනසුම් මෘදුකාංග ස්ථාපනය කරන ලද පරිගණක, බහුමාධ්‍ය ප්‍රක්ෂේපණයක්, ප්‍රායෝගික කටයුතු සඳහා අවශ්‍ය ලේඛනවල දෘඪ හා මෘදු පිටපත්, මුද්‍රක සහ අවශ්‍ය කොල
- https://www.gcflearnfree.org/word2016/formatting-text/1/

ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- වදන් සැකසුම් මෘදුකාංගයක ලක්ෂණ ලැයිස්තු ගත කරන ලෙස පැවරීමක් ලබා දීම
- දෙන ලද වදන් සැකසුම් මෘදුකාංග අතුරුමුහුණත් පිටපතක, කොටස් නම් කිරීමට උපදෙස් ලබා දීම
- ආකෘතිකරණය නොකරන ලද ලේඛනවල මෘදු පිටපත් ලබාදී දෙනලද ආකෘතීන් සිදු කර ලේඛන සුරැකීමට උපදෙස් දීම
- භාෂා ව්‍යවහාරයේ වැරදි සහිත ලේඛනවල මෘදු පිටපත් ලබාදී ඒවා නිවැරදි කර සුරැකීමට උපදෙස් ලබා දීම
- සෙවීම සහ ප්‍රතිස්ථාපනය සිදු කිරීමට අවශ්‍ය ලේඛනවල මෘදු පිටපත් ලබාදී ඒවා සිදු කිරීමට උපදෙස් ලබා දීම
- වගු ආශ්‍රිත ක්‍රියාකාරකම් සිදු කිරීමට අදාළ ලේඛන ලබාදී එම ක්‍රියාකාරකම් සිදු කරන ලෙස උපදෙස් දීම
- දෙන ලද ආකාරයට ලේඛන සුරැකීමට උපදෙස් ලබා දීම
- දෙන ලද සැකසුමට අනුව ලේඛන මුද්‍රණය කිරීමට උපදෙස් ලබා දීම

AlevelApi.com උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

කියවීම් ද්‍රව්‍ය :

වදන් සැකසුම් මෘදුකාංග

ලේඛන ආශ්‍රිත කාර්යයන් වන, ලේඛනයක් ආරම්භ කිරීම, සංස්කරණය කිරීම, ආකෘතිකරණය, මුද්‍රණය වැනි සියලු ම කාර්යයන් ඉටු කිරීම සඳහා සකස් කර ඇති යෙදුම් මෘදුකාංගයක් වදන් සැකසුම් මෘදුකාංගයක් ලෙස හැඳින්වේ.

වදන් සැකසුම් මෘදුකාංගවල යෙදුම්

ලිපියක්, අයදුම්පත්, අත් පත්‍රිකාවක්, වාර්තාවක් වැනි අක්ෂරවලින් සකස් වන ලේඛනයක් ආරම්භ කිරීම සහ අනෙකුත් සියලු ම ක්‍රියාකාරකම් සඳහා වදන් සැකසුම් මෘදුකාංග යොදා ගැනේ.

සුලබව හමුවන වදන් සැකසුම් මෘදුකාංග පැකේජ :

Microsoft Word, OpenOffice Writer, LibreOffice Writer etc.

වදන් සැකසුම් මෘදුකාංගයේ චිත්‍රක අතුරුමුහුණතේ සංරචක

මාතෘකා පේළිය(Title Bar) : අතුරුමුහුණතේ ඉහළින් ම පිහිටි ගොනුවේ නම සහ අදාළ යෙදුම දැක්වෙන තීරස් තීරුව

ආකෘතිකරණ මෙවලම් : ලේඛනයක් ආකෘතිකරණය සඳහා යොදා ගැනෙන මෙවලම් එකතුව

සංස්කරණ මෙවලම් : ලේඛනයේ වෙනස්කම් සිදු කිරීමට යොදා ගැනෙන මෙවලම් (කැපීම, තැන් මාරුව, කොපි කිරීම, ඇලවීම, ලොප් කිරීම (undo), අලොප් කිරීම(redo), සෙවීම සහ විස්ථාපනය, තේරීම ආදිය)

පිටු සැකසුම් මෙවලම් : ලේඛනයේ පිටුවකට අදාළ කාර්යයන් ඉටු කිරීම සඳහා ඇති මෙවලම් (පිටුවේ ප්‍රමාණය, පිටු සීමා, තීරු ආදිය සැකසීම සඳහා)

පෙනුම් මෙවලම් : ලේඛනයක් විවිධ ආකාරවලින් දර්ශනය කිරීම සඳහා ඇති මෙවලම්

සංස්කරණ පෙදෙස : අක්ෂර යතුරුලියනය කිරීමට සහ වෙනත් දේ ඇතුළත් කිරීමට හා සංස්කරණය කිරීම සඳහා ඇති චතුරස්‍රාකාර ප්‍රදේශය

නිවේශක ලක්ෂය(Insertion Point)/කර්සරය : කර්සරය යනු කුඩා I හැඩැති නිවෙන දැල්වෙන ආකාරයේ ඉරකි. මූසිකය මඟින් හෝ දිශා යතුරු මඟින් හෝ වෙනත් ක්‍රම මඟින් මෙය ලේඛනය පුරා ගෙන යා හැකි ය. මෙම ස්ථානයට අක්ෂර හෝ වෙනත් දෑ ඇතුළත් කළ හැකි බැවින් මෙයට ඇතුළත් කරණ ලක්ෂය ලෙසද හැඳින්වේ.

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ්‍ය හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

තත්ත්ව පේලිය(Status Bar): අතුරුමුහුණතේ පහළ ම සීමාවෙහි ඇති පේලිය මේ නමින් හැඳින්වේ. ලේඛනයෙහි පිටු සංඛ්‍යාව, දැනට සිටින පිටුව ඇතුළු විස්තර මෙහි දැක්වේ.

නව ලේඛනයක් ආරම්භකිරීම - වදන් සැකසුම් මෘදුකාංගයක් ක්‍රියාත්මක කළ විගසම නව ලේඛනයක් සෘජුව ම විවෘත වේ (සමහර යෙදුම් මෘදුකාංගවල 'New Document' තේරීමට අවස්ථාවක් ලබා දෙයි). පැරණි ලේඛනයක් විවෘත ව ඇති අවස්ථාවක වෙනත් ලේඛනයක් විවෘත කිරීමට **ctrl + N** යතුරු එකතුව හෝ මෙනුවෙහි අදාළ විධාන හෝ යොදා ගත හැකි ය.

ලේඛනයක, අක්ෂර යතුරුලියනය කිරීම හා මැකීම

- යතුරුපුවරුව භාවිතයෙන් අක්ෂර යතුරුලියනය කළ හැකි අතර මෙවලම් භාවිතයෙන් වෙනත් සංකේත ද ලේඛනයට ඇතුළත් කළ හැකි ය. Delete හෝ Backspace යතුරු මඟින්, ඇතුළත් කරන ලද අක්ෂර හෝ වෙනත් දෑ හෝ මැකීමට හැකි ය.
    - Delete යතුර - කර්සරයෙන් දකුණු පසින් ඇති අක්ෂර කර්සරය මතට පැමිණ මැකී යයි
    - Backspace යතුර මඟින් කර්සරය වම් පසට ගමන් කරමින් වම් පස ඇති අක්ෂර මකා දමයි
    - ලකුණු කරන ලද (highlighted) අක්ෂර හෝ වෙනත් දෑ හෝ මෙම යතුරු දෙකින් කුමන හෝ එකක් මඟින් මකා දැමිය හැකි ය

අක්ෂර ආකෘතිකරණය

යතුරුලියනය කිරීමට පෙර පාඨයකට ආකෘතිකරණයන් යෙදිය යුතු නම්, අදාළ මෙවලම/මෙවලම් මත ක්ලික් කර එය සක්‍රිය කර, පසුව අදාළ පාඨ ලිවිය හැකි ය. ආකෘතිකරණ අවසන් කිරීමට, නැවත සක්‍රිය කරන ලද මෙවලම මත ක්ලික් කර එය අක්‍රිය කළ යුතු ය.

යතුරුලියනය කිරීමෙන් පසු පාඨයකට ආකෘතිකරණයන් යෙදිය යුතු නම්,අදාළ කොටස තෝරා පසුව අවශ්‍ය මෙවලම් මත ක්ලික් කළ යුතු ය.

ආකෘතිකරණ ආකාර

තද අකුරු(Bold), ඇද අකුරු(Italic), යටින් ඉරි(Underline),අක්ෂර පැහැය(Text colour) , අක්ෂර පසුතලයේ පැහැය (Text background colour), විලාස(Styles) ආදිය.

ඡේද ආකෘතිකරණය

අදාළ ඡේදය මත සිට අවශ්‍ය මෙවලම(button) මත ක්ලික් කිරීමෙන් ඡේදය අවශ්‍ය පරිදි සකසා ගත හැකි ය.Ex. Indentation, එකෙල්ල කිරීම (Alignment) , Line spacing etc.

ලේඛනයක් සංස්කරණය කිරීම

ලොප් කිරීම (Undo)- මෑතකදී කරන ලද ක්‍රියාවන් ආපස්සට අවලංගු කිරීමට මෙම මෙවලම යොදා ගැනේ. අනවශ්‍ය ක්‍රියාවන් අවලංගු කිරීමට මෙය වැදගත් වේ.

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

අලොප් කිරීම(Redo)– අවලංගු කරන ලද ක්‍රියාවන් නැවත එම අනුපිළිවෙලටම ලබා ගැනීම සඳහා මෙම මෙවලම යොදා ගැනේ. මෙහිදී කලින් ලොප් කරන ලද දෙය නැවත ලැබේ.

කැපීම (Cut)- එක් ස්ථානයක ඇති පාඨයක් හෝ වෙනත් දෙයක් හෝ වෙනත් ස්ථානයකට ගෙන යාමට මෙය යොදා ගැනේ. මෙම විධානයේ දී තෝරා ගත් පාඨය හෝ දෙය හෝ මුල් ස්ථානයෙන් ඉවත් ව ක්ලිප් පුවරුවට යයි

කොපි කිරීම - එක් ස්ථානයක ඇති පාඨයක් හෝ වෙනත් දෙයක් හෝ වෙනත් ස්ථානයකට කොපි කිරීමට මෙය යොදා ගැනේ.මෙම විධානයේ දී තෝරා ගත් පාඨය හෝ දෙය හෝ මුල් ස්ථානයේ තිබිය දීම එහි පිටපතක් ක්ලිප් පුවරුවට යයි

ඇලවීම -කපන ලද හෝ කොපි විධානය දී ක්ලිප් පුවරුවට යවන ලද හෝ දෙය නව ස්ථානයට ඇලවීම සඳහා මෙම විධානය අවශ්‍ය වේ. මෙම විධානය ක්‍රියාත්මක නොකළහොත් කපන ලද හෝ කොපි කරන ලද දෙය නව ස්ථානයට ඇතුළත් නොවේ.

සෙවීම සහ ප්‍රතිස්ථාපනය (Find and Replace) - ලේඛනයෙහි ඇති වචනයක් සෙවීමට සෙවීම විධානය ද, වචනයත් වෙනුවට වෙනත් වචනයක් යෙදීමට ප්‍රතිස්ථාපන විධානය ද යොදා ගැනේ. මෙහි දී ලේඛනයේ ඇති එක් පාඨයක් සියලු ම ස්ථානවල එකවර ප්‍රතිස්ථාපනය කළ හැකි ය.

ව්‍යාකරණ හා අක්ෂර පරීක්ෂාව - ලේඛනයක ඇති අක්ෂර දෝෂ සහිත වචනයක් හෝ ව්‍යාකරණ දෝෂයක් හෝ නිවැරදි කර ගැනීමට මෙම විධානය යොදා ගැනේ.

අක්ෂර නොවන විවිධ දේ ලේඛනයකට ඇතුළත් කිරීම - විවිධ හැඩතල, රූප සටහන්, ප්‍රස්තාර, ක්ලිප් ආට් ඇතුළු අක්ෂර නොවන වස්තු ඇතුළත් කිරීමට 'Insert' විධානය යොදා ගැනේ. ඇතුළත් කරගත් වස්තුව සංස්කරණය කිරීමටද හැකි ය.

සමීකරණ, සංකේත, අධිසම්බන්ධක, පිටු සලකුණු, පිටු බිඳුම්, දිනය හා වේලාව ආදිය ද අවශ්‍ය පරිදි ලේඛනයට ඇතුළත් කර ගත හැකි ය.

කෙටි මං යතුරු

මෙනූ හෝ මෙවලම් හෝ භාවිත නොකර, යතුරු පුවරුව හරහා ලේඛනයක බොහෝ කාර්යයන් සිදු කර ගත හැකි ය. නිතර භාවිතයට අවශ්‍ය විය හැකි කෙටි මං යතුරු සංයෝජන කිහිපයක් පහත දැක්වේ:

Control + N – එක්වරම නව ලේඛනයක් ආරම්භ කිරීම සඳහා

Control + p – මුද්‍රණ සංවාද කොටුව විවෘත කිරීම සඳහා

Control + C – තෝරා ගත් පාඨයක් හෝ වස්තුවක් හෝ කොපි කිරීම සඳහා

Control + X – තෝරාගත් පාඨයක් හෝ වස්තුවක් හෝ කැපීම සඳහා

Control + V – කපන ලද හෝ කොපි කරන ලද හෝ දෙයක් කර්සරය ඇති ස්ථානයේ ඇලවීම සඳහා

Control + Z - ලොප් කිරීම (Undo) සඳහා

Control + Y - අලොප් කිරීම (Redo) සඳහා

AlevelApi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

වගු ආශ්‍රිත ක්‍රියා

දත්ත, ලැයිස්තු ආකාරයෙන් ඇතුළත් කිරීම සඳහා වගු යොදා ගැනේ. උදා: කාලසටහනක් සෑදීම

වගු සෑදිය හැකි ආකාර :

1. පේළි සහ තීරු සංඛ්‍යා ලබාදී වගු ඇතුළත් කිරීම
2. අවශ්‍ය පරිදි වගු ඇඳීම

වගුවක් ඇතුළත් කිරීමෙන් පසු එයට, නව පේළි හා තීරු ඇතුළත් කිරීම, කොටු එකතු කිරීම(Merge), කොටු අවශ්‍ය පරිදි බෙදීම සහ වෙනත් ආකාරයේ ආකෘතිකරණ සිදු කළ හැකි ය (ඉරිවල ඝනකම, විලාස ආදිය)

ලේඛන සුරැකීම

ලේඛනයක් විවිධ ආකාරවලින් විවිධ ස්ථානයන්හි සුරැකිය හැකි ය. එක ම යෙදුමේ වෙනත් සංස්කරණයක් වශයෙන් ආදිය

මුද්‍රණයට පෙරදැක්ම (Print preview)

ලේඛනයක් මුද්‍රණය වන ආකාරය මුද්‍රණයට පෙර බලා ගත හැකි ය

මුද්‍රණ පිහිටුම (Print setup)

ලේඛනයක් මුද්‍රණය විය යුතු අන්දම තෝරා ගත හැකි ය. එනම් පිටු ගණන, කොපි සංඛ්‍යාව, කොළයේ දෙපැත්තෙහි ම මුද්‍රණය කිරීම, දිය සලකුණු මුද්‍රණය ආදිය

මෙම පිහිටුම් තෝරා මුද්‍රණය කිරීමේ විධානය ලබා දුන් විට අදාළ ලේඛනය එපරිද්දෙන් මුද්‍රණය වේ.

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

නිපුණතා මට්ටම 4.2 :සරල ගණිත ගැටලු විසඳීම සඳහා පැතුරුම් පත් මෘදුකාංග භාවිත කරයි

කාලච්ඡේද සංඛ්‍යාව : 06

ඉගෙනුම් පල :

- පැතුරුම්පත් මෘදුකාංග සංක්ෂිප්ත ව විස්තර කරයි
- බහුල ව දක්නට ලැබෙන පැතුරුම් පත් මෘදුකාංග ලැයිස්තු ගත කරයි
- පැතුරුම්පත් මෘදුකාංගවල කාර්යයන් ලැයිස්තු ගත කරයි
- පැතුරුම්පත් මෘදුකාංගවල චිත්‍රක අතුරු මුහුණතේ සංරචක හා ලක්ෂණ හඳුනාගනී
- අවශ්‍ය පරිදි, සක්‍රිය කොටුව **(Active Cell)** වැඩපතක චිහා මෙහා ගෙනයයි
- කොටුවක ඇතුළත් කළ හැකි දත්ත ප්‍රරූප ලැයිස්තු ගත කරයි
- අවශ්‍ය පරිදි කොටුවකට අදාළ ආකෘතිකරණ යොදයි
- වැඩපතකට, අවශ්‍ය පරිදි පේළි සහ තීරු ඇතුළත් කරයි
- වැඩපතක ඇති අනවශ්‍ය පේළි සහ තීරු ඉවත් කරයි
- අවශ්‍ය පරිදි වැඩපත් ඇතුළත් කරයි, මකා දමයි, නැවත නම් කරයි
- කෝෂ පරාසයක් තෝරා නම් කරයි
- කෝෂයක අඩංගු දෑ කොපි කිරීම හා විතැන් කිරීම අවශ්‍ය පරිදි සිදු කරයි
- අගයයන් හා මූලික ගණිතමය කාරක භාවිතයෙන් මූලික ගණිත කර්ම සිදු කරයි
- සාපේක්ෂ හා නිරපේක්ෂ කෝෂ යොමු භාවිතයෙන් මූලික ගණිත කර්ම සිදු කරයි
- අභ්‍යන්තර ශ්‍රිත යොදා ගනිමින් මූලික ගණිත කර්ම සිදු කරයි
- අවශ්‍යතාව මත සුදුසු ප්‍රස්තාර වර්ගය හඳුනා ගනී
- ප්‍රස්තාර නිර්මාණය කරයි
- දත්ත පෙරීම සිදු කරයි
- නිසි පරිපාටියකට අනුව දත්ත තේරීම සිදු කරයි
- අවශ්‍යතාවට අනුව පිටු සකසයි
- මුද්‍රණ පෙර දැක්ම බලා මුද්‍රණය කරයි

විෂය අන්තර්ගතය :

- පැතුරුම් පත් මෘදුකාංග හැඳින්වීම
- පැතුරුම් පත් මෘදුකාංගවල චිත්‍රක අතුරු මුහුණත
  - වැඩ පොත
  - වැඩපත
  - පේළි
  - තීරු
  - කොටු/කෝෂ
  - සමීකරණ පටිය **(Formula Bar)**
  - කෝෂ යොමුවේ **(Cell pointer)** හැඩය අනුව චිහි ක්‍රියාකාරිත්වය
- වැඩපතේ චිහා මෙහා සක්‍රිය කොටුව ගෙනයාම

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

- කෝෂයක ඇතුළත් කළ හැකි දත්ත ප්‍රරූප
  - පාඨ (Text)
  - සංඛ්‍යා
  - සමීකරණ
- කෝෂ ආකෘතිකරණය
  - සංඛ්‍යා
  - එකෙල්ල කිරීම
  - අක්ෂර
- පේළි සහ තීරු ඇතුළත් කිරීම
- පේළි සහ තීරු ඉවත් කිරීම
- වැඩපත
  - නම වෙනස් කිරීම
  - ඇතුළත් කිරීම
  - ඉවත් කිරීම
- කෝෂ පරාසයක් තේරීම සහ නම් කිරීම
- කෝෂ අන්තර්ගතය කොපි කිරීම සහ විතැන් කිරීම
  - කැපීම, කොපි කිරීම, ඇලවීම/විශේෂ ඇලවීම
- සරල ගණනය කිරීම්
  - මූලික ගණිත කර්ම ආශ්‍රිත ගණණය කිරීම් (+ , - , * , /)
  - කෝෂ යොමු සහ කාරක ආශ්‍රිත ගණනය කිරීම්
- අභ්‍යන්තර ශ්‍රිත
  - ිමප, average, max, min, count and rank
- ප්‍රස්තාර වර්ග
  - ස්තම්භ, දඬු, රේඛා, වෘත්ත
- ප්‍රස්තාර මෙවලම්
  - සැලසුම, වින්‍යාසය, ආකෘතිය
- දත්ත පෙරීම
- දත්ත තේරීම
- වැඩපත් මුද්‍රණය
  - පිටු සැකසුම
  - පිටු විකල්ප
  - මායිම් විකල්ප
  - වැඩපත් විකල්ප
- මුද්‍රණ පෙර පෙනුම
- මුද්‍රණය

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

මූලික වදන්/සංකල්ප :

- පැතුරුම් පත් මෘදුකාංගයක අවශ්‍යතාව කෙරෙහි අවධානය යොමු කිරීම
- පරිශීලක අතුරු මුහුණත හඳුනා ගැනීම
- වැඩපතක චිහ්න මෙහ්න සක්‍රිය කොටුව ගෙනයාම
- සියලු ම සිසුන්හට පැතුරුම් පතක් පරිශීලනය කිරීමේ හැකියාව ලබා දීම
- මූලික කාර්යයන් ඇසුරින් සරල අංකගණිත මෙහෙයුම්
- සාපේක්ෂ සහ නිරපේක්ෂ කෝෂ යොමුවල වෙනස
- සමීකරණ කොපි කිරීමේ දී කෝෂ යොමුවල හැසිරීම
- කෝෂ යොමු ආශ්‍රිත සරල ගණනය කිරීම්
- සමීකරණයක් කොපි කිරීම සඳහා ‘auto fill’ යොදා ගැනීම
- අභ්‍යන්තර සමීකරණ සහ ශ්‍රිත සුදුසු ලෙස භාවිතය
- සුදුසු ප්‍රස්තාර සහ සුදුසු ආකෘතිකරණ කෙරෙහි අවධානය යොමු කිරීම
- විශේෂිත දත්ත පෙරීමේ පහසුකම කෙරෙහි අවධානය යොමු කිරීම
- විශේෂිත නිර්ණායක මත දත්ත තේරීම කෙරෙහි අවධානය යොමු කිරීම
- අවශ්‍ය පරිදි පිටු සහ මුද්‍රණ පිහිටුම් සිදු කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම
- පුරුද්දක් ලෙස, මුද්‍රණයට පෙර, මුද්‍රණ පෙර දැක්ම භාවිත කිරීමට සිසුන් යොමු කිරීම

පාඩම් සැලසුම් සඳහා උපදෙස් :

- පැතුරුම් පත් මෘදුකාංගයක ලක්ෂණ සාකච්ඡා කිරීම හා ප්‍රදර්ශනය කිරීම
- සරල ලකුණු ලැයිස්තුවක් පිළියෙළ කිරීමට උපදෙස් දීම **(අවම සිසුන් 10** දෙනෙකුගේ විෂය **03**ක්**)**
- වැඩපතක චිහ්න මෙහ්න යන ආකාරය ප්‍රදර්ශනය කිරීම
- වැඩපත් ක්‍රියාකාරකම්වලට අදාළ ව කලින් සූදානම් කොට ඇති වැඩපත් සැපයීම
- සරල අංකගණිත මෙහෙයුම් පිළිබඳ ව සාකච්ඡා කිරීම සහ ප්‍රදර්ශනය කිරීම
- ශ්‍රිතවල උපයෝගිතාව පිළිබඳ ව සාකච්ඡා කිරීම සහ ප්‍රදර්ශනය කිරීම
- සාපේක්ෂ සහ නිරපේක්ෂ යොමු යොදා ගන්නා විට ශ්‍රිතවල හැසිරීම සොයා බැලීමට සිසුන් යොමු කිරීම
- මූලික ගණිත කර්ම ආශ්‍රිත ගණනය කිරීම් ඇතුළත් වැඩපත් සැපයීම **(**මූලික ගණිත කර්ම, අභ්‍යන්තර ශ්‍රිත, සමීකරණ, කෝෂ යොමු ඇතුළත්**)**
- පරීක්ෂණ දත්ත මත ප්‍රස්තාර ඇතුළත් කිරීම හා ආකෘතිකරණය ප්‍රදර්ශනය කිරීම
- පිටු ආකෘතිකරණය, මුද්‍රණ පෙර දැක්ම හා මුද්‍රණය පිළිබඳ ව සාකච්ඡා කරමින් ප්‍රදර්ශනය කරන්න

AlevelApi.com උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ්‍ය හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

ගුණාත්මක යෙදවුම්

- පැතුරුම් පත් මෘදුකාංගය සහ අන්තර්ජාල සම්බන්ධතාව සහිත පරිගණක, බහු මාධ්‍ය ප්‍රක්ෂේපණයක්, මුද්‍රකයක් සහ මුද්‍රණ කඩදාසි, ප්‍රායෝගික වැඩපත්වල දෘඪ පිටපත්

ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- දෙන ලද ලකුණු ලැයිස්තුවක් (දෘඪ පිටපතක්) පැතුරුම් පත් මෘදුකාංගයක් මත සකස් කිරීමට අවස්ථාව ලබා දීම
- දෙනලද අභ්‍යාසයට අනුව වැඩපතේ චිහා මෙහා යාම පිළිබඳ ව අභ්‍යාස කරවන්න
- ගණනය කිරීම් ඇතුළත් වැඩ පතක් ලබා දී අදාළ අභ්‍යාස කරවන්න
- දත්ත ඇතුළත් වැඩපතක් ලබාදී ඒම දත්ත ඇසුරින් සුදුසු ප්‍රස්තාර නිර්මාණය කිරීමට යොමු කරන්න
- නිර්ණායක සහිත ව දත්ත ඇතුළත් පැතුරුම් පතක් නියැදියක් ලෙස ලබා දෙන්න
- ඒ අනුව දත්ත පෙරීමට සහ තේරීමට අදාළ අභ්‍යාස කරවන්න
- චිය නිශ්චිත ගොනු බහලුවක තැන්පත් කිරීමට උපදෙස් ලබා දෙන්න
- මුද්‍රණ නිර්ණායක සහිත වැඩපතක් ලබා දෙන්න
- දෙන ලද නිර්ණායක අනුව වැඩපත මුද්‍රණය කිරීමට උපදෙස් දෙන්න

AlevelApi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

කියවුම් ද්‍රව්‍ය

පැතුරුම් පත් මෘදුකාංග

ගණිතමය මෙහෙයුම් ඉටු කිරීම සඳහා යොදා ගනු ලබන අන්තර් ක්‍රියාකාරී ඉලෙක්ට්‍රොනික පරිගණක යෙදුමක් පැතුරුම් පතක් ලෙස හැඳින්වේ. එමෙන් ම එය සංඛ්‍යාත්මක දත්ත ගබඩා කිරීම, සංවිධානය කිරීම, විශ්ලේෂණය කිරීම සහ ප්‍රාස්තාරික නිරූපණය සඳහාද යොදා ගත හැකි ය.

පැතුරුම්පත් මෘදුකාංග සඳහා උදාහරණ

- Google Sheets - (Online and free)
- Apple Numbers - Apple iWork Suite.
- LibreOffice - Calc (Free)
- Microsoft Excel – Microsoft Office suite
- OpenOffice - Calc (Free)

වැඩ පොත

පැතුරුම් පත් ගොනුවක් වැඩ පොතක් ලෙස හැඳින්වේ. (උදා: ABC.xls)

වැඩපත

වැඩපොතේ එක් පිටුවක් වැඩපතක් ලෙස හැඳින්වේ

පේලි

වැඩපතේ සිරස් අතට පිහිටි කොටු එකතුවක් පේලියක් නම් වේ. පළමු පේලිය ඉංග්‍රීසි හෝඩියේ මුල් අකුරින් ආරම්භ වී අවසානය තෙක් ඉදිරියට නම් කරයි (උදා: A, B, C……AA, BB, CC……).

තීරු

වැඩපතේ තිරස් අතට පිහිටි කොටු එකතුවක් තීරුවක් නම් වේ. පළමු තීරුව 1න් ආරම්භ වී අවසානය තෙක් ව්‍යාප්ත ව පවතී(1, 2, 3, ……65536, ……)

කොටු/කෝෂ

පේලියක් සහ තීරුවක් එකතු ව කොටුවක් හෙවත් කෝෂයක් නිර්මාණය වේ. පළමු කොටුව 1A වන අතර එයද අවසාන පේලියේ අවසාන තීරුව තෙක් ව්‍යාප්තව පවතී. (A1,B5, ……. CD345,……)

කෝෂ පරාසය


එක් වර තෝරා ඇති කොටු කිහිපයක් කෝෂ පරාසයක් ලෙස හැඳින්වේ. කෝෂ පරාසයක් එකට ඈඳුනු කොටු කිහිපයකින් හෝ වෙනස් ස්ථානවල පිහිටි කොටු කිහිපයකින් හෝ සමන්විත විය හැකි ය.

AlevelApi.com උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බෝනස් දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

සමීකරණ පේළිය

පැතුරුම් පත් අතුරු මුහුණතේ ඉහළින් පිහිටි කොටුවකි. කොටු තුළ අඩංගු දෑ මෙහි පෙන්වයි (සක්‍රිය කොටුවේ අඩංගු දෑ)


කොටු යොමුවේ හැඩය අනුව එහි ක්‍රියාකාරිත්වය



+ ආකාරයේ දී **(Fill Handle)** කොටුවක හෝ පරාසයක හෝ ඇති දෑ අනුයාත කොටු වකකට හෝ කිහිපයකට කොපි හෝ කිරීමට යොදා ගත හැකි ය.



Cross Pointer – කෝෂයක හෝ කෝෂ කිහිපයක හෝ පරාසයක් තේරීමට හැකි ය



කොටුවක හෝ පරාසයක හෝ ඇති යමක් වෙනත් කොටුවකට විතැන් කිරීමට යොදා ගනී.

වැඩපතක් හරහා කෝෂ යොමුව ගෙනයාම

වැඩපතක කොටුවකට, කිසියම් පේළියකට නොහොත් තීරුවකට, අවසාන පේළියට/තීරුවට, පළමු පේළියට/තීරුවට, නිශ්චිත කොටුවකට, දත්ත සහිත පෙදෙසක කෙළවරවලට ආදි වශයෙන් විවිධ ආකාරයෙන් කෝෂ යොමුව ගෙනයා හැකි ය.

එමෙන් ම පිටුවෙන් පිටුව ද කොටු යොමුව ගෙනයා හැකි ය

දත්ත ප්‍රරූප

පාඨ, සංඛ්‍යා, සමීකරණ

පාඨ - සංඛ්‍යා නොවන අක්ෂර, වෙනත් අනුලක්ෂණ ආදිය මෙහි අඩංගු විය හැකි ය

උදා:- excel, 10A ,5km, “2000”

සංඛ්‍යා - ගණනය කිරීම් සඳහා අවශ්‍ය වන සංඛ්‍යා මෙම වර්ගයට අයත් වේ

උදා: ,1,4,233,1000, -123, $32 ආදිය

සමීකරණ

ගණනය කිරීම් සඳහා යොදා ගැනෙන සමීකරණ මෙම වර්ගයට අයත් වේ. සමීකරණයක් සැම විට ම සමාන (‘=’) ලකුණින් ආරම්භ විය යුතු ය.

උදා: =C1+D2, =A1+B2*5, =sum(range)

කොටු ආකෘතිකරණය

කොටු ආකෘතිකරණය මඟින් කොටුවක පෙනුම මෙන් ම එහි අඩංගු දෑ වෙනස් කිරීමට ඉඩ කඩ සලසා දෙයි.

AlevelApi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

- අක්ෂර - අක්ෂර මුහුණත(වර්ගය), ප්‍රමාණය, පැහැය, තද අකුරු, ඇල අකුරු, යටින් ඉරි ඇඳීම
- එකෙල්ල කිරීම - සිරස්, තිරස් සහ දිශානතිය
- පෙළ එතුම **(Text wrapping)**, කොටු එකතු කිරීම සහ මධ්‍යයට ගෙනඒම **(Merge and centre)**
- ඉලක්කම් ආකෘතිකරණය - මුදල්, ප්‍රතිශත, දිනය හා වේලාව, විද්‍යාත්මක ආකෘතිය, දශමස්ථාන අඩු/වැඩි කිරීම

පේලි/තීරු/කොටු/පත් ඇතුළත් කිරීම

- පවතින දත්ත සහිත පේලි සහ තීරු අතරට අලුතින් පේලි සහ තීරු ඇතුළත් කොට ඒවාට අවශ්‍ය පරිදි දත්ත ඇතුළු කළ හැකි ය. එමෙන් ම, නව වැඩපත් ද වැඩපොතකට ඇතුළත් කළ හැකි ය.

පේලි/තීරු/කොටු/වැඩපත් මැකීම

- පවතින අනවශ්‍ය පේලි, තීරු සහ කොටු මෙන් ම වැඩපත් ද ඉවත් කිරීමට ද හැකි ය.

වැඩපත් නැවත නම් කිරීම

- වැඩපතක පවතින නම වෙනුවට වෙනත් අදාළ නමක් යෙදිය හැකි ය. මෙමඟින් අදාළ වැඩපත පහසුවෙන් හඳුනා ගත හැකි ය.
  - on the sheet tab→select Rename → Type the new name

ගණනය කිරීම්

පැතුරුම් පත් මෘදුකාංගයක් මඟින් අංක ගණිතමය ගණනය කිරීම් පහසුවෙන් ඉටු කර ගත හැකි ය. පැතුරුම් පත් මෘදුකාංගයක ප්‍රධාන කාර්යය මෙය යි. එමෙන් ම තාර්කික, මූල්‍ය, සංඛ්‍යාන, ඉංජිනේරු ආදි බොහෝ ගණනය කිරීම් ද පැතුරුම් පත හරහා පහසුවෙන් ඉටු කර ගත හැකි ය.

ගණිත කර්ම

Calculation	Example
Addition	=B2+D2
Subtraction	=C3-B3
Multiplication	=D9*D10
Division	=G9/G10
Raise to a power (exponent)	=D14^2

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

සාපේක්ෂ හා නිරපේක්ෂ කෝෂ යොමු

සාපේක්ෂ කෝෂ යොමුව

පැතුරුම්පතක පවතින යොමුව සාපේක්ෂ කෝෂ යොමුව යි. මෙහිදී කෝෂ යොමුව කිසිදු උපසර්ගයකින් තොර ව ලියනු ලැබේ. උදා: A1, B4

සමීකරණ ආදිය කොපි කිරීමේ දී පේලි/තීරු අදාළ පරිදි වෙනස් වේ. උදා: **=A2+B2+C2**සමීකරණය දෙවෙනි පේළියේ සිට තුන්වන පේලියට කොපි කිරීමේ දී එහි අගය **=A3+B3+C3**ලෙස වෙනස් වේ. එක ම ගණණය කිරීම නැවත නැවත කිරීමේ දී මෙය ඉතා පහසු ය.

නිරපේක්ෂ කෝෂ යොමුව

කෝෂ යොමුවේ සංකේතවලට මුලින් ($) සලකුණ යෙදීමෙන් අදාළ කෝෂය නිරපේක්ෂ බවට පත් කළ හැකි ය.

A1	කොපි කිරීමේදී පේලිය සහ තීරුව යන දෙකම වෙනස් නොවී පවතී
A$1	කොපි කිරීමේදී පේලියපමණක් වෙනස් නොවී පවතී
$A1ත	කොපි කිරීමේදී තීරුව පමණක් වෙනස් නොවී පවතී

ශ්‍රිත

පැතුරුම් පතක කලින් නිර්ණය කොට ඇති සමීකරණ , ශ්‍රිත නමින් හැඳින්වේ. මෙම ශ්‍රිත විශාල සංඛ්‍යාවක් පැතුරුම් පත් මෘදුකාංගයක ඇත.

ශ්‍රිතයක් ලියන ආකාරය : *= Function_name(parameters)*

උදා :

	A	B
1		Marks
2		42
3		50
4		40
5		81
6		64
7		76
8	Total	
9	Average	
10	Maximum	
11	Minimum	
12	Count	

= Sum (Range) මඟින් අදාළ පරාසය තුළ ඇති සංඛ්‍යාවල එකතුව ලබාදෙයි.

B8 කොටුවෙහි, **= sum(B2:B7)**ලියූ විට එහි අගය ලෙස 353 ලැබේ.

= Average (Range) මඟින් අදාළ පරාසය තුළ ඇති සංඛ්‍යාවල සාමාන්‍ය අගය ලබාදෙයි

B9 කොටුවෙහි, =Average(B2:B7)ලියූ විට එහි අගය ලෙස 58.83 ලැබේ.

=Max(Range)මඟින් අදාළ පරාසය තුළ ඇති සංඛ්‍යා අතර ඇති උපරිම අගය ලබාදෙයි

B10 කොටුවෙහි,=max (B2:B7)ලියූවිට, එහි 81 ලැබේ

=Min(Range)මඟින් අදාළ පරාසය තුළ ඇති සංඛ්‍යා අතර ඇති අවම අගය ලබාදෙයි

B11 කොටුවෙහි, =min (B2:B7)ලියූවිට, එහි 40 ලැබේ

AlevelApi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

=Count(Range)මඟින් අදාළ පරාසය තුළ ඇති සංඛ්‍යාමය අගයන් සහිත කොටු ගණන ලබාදෙයි

B11 කොටුවෙහි, =count (A1:B7) ලියූවිට, එහි 6 ලැබේ

B	C
Marks	Rank
42	5
50	4
40	6
81	1
64	3
76	2

=Rank(number,ref,order) මඟින් සංඛ්‍යා පරාසය තුළ අගය අනුව ස්ථානය ලබා දේ.

Number : අගය/අගය සහිත කෝෂයේ යොමුව, Ref : ස්ථානයන් සෙවිය යුතු පරාසය

Order : 0 හෝ හිස් ව ඇත් නම් ස්ථානය ආරෝහණ ලෙස ද, වෙනත් අගයක් නම් අවරෝහණ ලෙස ද ලැබේ

C2 කෝෂයෙහි = rank(b2, b2:b7), ලියූ විට එහි ස්ථානය ලෙස 5 ලැබේ. මෙය මේ ආකාරයෙන් ම පහළට කොපි කළහොත් ලැබෙන අගය නිවැරදි නොවේ (සාපේක්ෂ කෝෂ යොමුව ක්‍රියාත්මක වීම නිසා). එබැවින් මෙම සමීකරණයේ පරාසය පේලි නිරපේක්ෂ ආකාරයෙන් ලිවිය යුතු ය.

එනම්: =rank(b2,b$2:b$7) ලෙස ලිවිය යුතු ය. එවිට අදාළ පේලි අගය (2-7) නොවෙනස් ව පවතී.

(මෙය පැහැදිලි වනසේ අභ්‍යාස කරවන්න)

වගු

වැඩපොතක දත්ත දෘශ්‍ය ආකාරයෙන් නිරූපණය කිරීම සඳහා වගු භාවිත වේ. එමඟින් දත්ත පහසුවෙන් තේරුම් කර ගත හැකි වනු ඇත. අවශ්‍යතාව අනුව විවිධ වර්ගයේ වගු තෝරා ගැනීමේ පහසුකම පැතුරුම් පත් මෘදුකාංග සතු ව ඇත.

- ස්තම්භ ප්‍රස්තාර (Column charts)
- දඬු ප්‍රස්තාර (Bar Charts)
- රේඛා ප්‍රස්තාර(Line Charts)
- වට ප්‍රස්තාර (Pie Charts)

පැතුරුම් පත් මෘදුකාංග හරහා දත්ත තේරීම සහ පෙරීම

දත්ත තේරීම

පැතුරුම් පත් මෘදුකාංග හරහා අවශ්‍ය පරිදි දත්ත, පේලියක් හෝ පේලි කිහිපයක් හෝ අනුව, ආරෝහණ/ අවරෝහණ පරිපාටියට අනුව හෝ ඔබට අවශ්‍ය වෙනත් නිර්ණායක අනුව හෝ තෝරා ගැනීමේ පහසුකම ඇත.

දත්ත පෙරීම

පැතුරුම් පත් මෘදුකාංග හරහා දත්ත අවශ්‍ය පරිදි පෙරා ලබා ගත හැකි ය. දෙන ලද නිර්ණායකයනට අනුව අවශ්‍ය දත්ත උපකුලකයක් වෙන්කොට ලබා ගත හැකි ය.

AlevelApi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

වැඩපතක් මුද්‍රණය කිරීම

සම්පූර්ණ වැඩපත හෝ ඉන් අවශ්‍ය කොටසක් හෝ මුද්‍රණය කර ගැනීමේ පහසුකම පැතුරුම්පත් මෘදුකාංග තුළ දක්නට ඇත.මුද්‍රණයට පෙර පහත දැක්වෙන වෙනස්කම් සිදු කොට පැතුරුම් පත සකස්කොට ගත හැකි ය.

- පිටු විකල්ප(දිශානතිය, ප්‍රමාණය ඇදිය)
- පිටු දාර, සහ චිකෙල්ල කිරීම ආදිය
- පැතුරුම් පත් විකල්ප(මුද්‍රණ පෙදෙස, කොටු රේඛා (grid lines), පුනර්කරණය විය යුතු පේලි/තීරු ආදිය

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

නිපුණතා මට්ට 4.3 :ඉදිරිපත් කිරීමක්, වඩාත් ආකර්ෂණීය ලෙස සිදු කිරීම සඳහා, ඉලෙක්ට්‍රොනික සමර්පණ මෘදුකාංගයක් යොදා ගැනේ

කාලච්ඡේද සංඛ්‍යාව : 04

ඉගෙනුම් ඵල :

- ඉලෙක්ට්‍රොනික සමර්පණ මෘදුකාංග කෙටියෙන් පැහැදිලි කරයි
- ඵලදායී සමර්පණයක ලක්ෂණ ලැයිස්තු ගතකර පැහැදිලි කරයි
- සමර්පණ මෘදුකාංගවල භාවිතය කෙටියෙන් සාකච්ඡා කරයි
- සමර්පණ මෘදුකාංගවල සහලක්ෂණ සාකච්ඡා කරයි
- සමර්පණ මෘදුකාංගයක් භාවිතයෙන් සමර්පණයක් නිර්මාණය කරයි
- අන්තර්ගතයට සුදුසු පරිදි කදා පිරිසැලසුමක් තෝරා ගනී
- කදාව මත වගන්ති, වගු, හැඩතල, රූප සටහන්, වීඩියෝ සහ හඬ ශීර්ෂ සහ පාදක, පිටු අංක, අධි සම්බන්ධක **(hyperlinks),** ක්‍රියාකාරී බොත්තම්(action buttons), මාධ්‍ය පසුරු **(Media Clip)** ආදිය ඇතුළත් කරයි
- ගැළපෙන පරිදි අභිරුචි සජීවකරණ සහ කදා සංක්‍රාන්තිය **(Custom Animation & Slide Transition)**යොදා ගනී
- කදා පසුබිම සැලසුම් කර යොදාගනියි
- ඉදිරිපත් කිරීමක් විවිධ ආකාරයෙන් ආරක්ෂා කරයි
- ආවේණික කෙටිමං යතුරු භාවිත කරයි
- ඉදිරිපත් කිරීමක් ගැළපෙන පරිදි මුද්‍රණය කිරීමට පෙර දැක්ම**(print preview)** නරඹයි
- ඉදිරිපත් කිරීමක් ගැළපෙන පරිදි මුද්‍රණය කරයි

විෂය අන්තර්ගතය :

- ඉලෙක්ට්‍රොනික සමර්පණ මෘදුකාංග හැඳින්වීම
- සාර්ථක/ඵලදායී සමර්පණයක ලක්ෂණ
- සමර්පණ මෘදුකාංගවල සහලක්ෂණ
- සමර්පණ මෘදුකාංගවල භාවිතය
- කදා පිරිසැලසුම තේරීම
- කදා පසුබිම සකස් කිරීම
- වගන්ති සහ බහුමාධ්‍ය දෑ ඇතුලත් කිරීම
- අභිරුචි සජීවකරණ සහ කදා සංක්‍රාන්තිය**(Custom Animation & Slide Transition)** යොදා ගැනීම
- සමර්පණ මෘදුකාංගයට ආවේණික කෙටිමං යතුරු
- ඉදිරිපත් කිරීමක් විවිධ ආකාරයෙන් ආරක්ෂා කිරීම
- ඉදිරිපත් කිරීමක් විවිධ ආකාරයෙන් මුද්‍රණය කිරීම

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

මූලික වදන්/සංකල්ප :

- ඵලදායී සමර්පණ මෘදුකාංගයක අවශ්‍යතාව සහ ලක්ෂණ අවධාරණය
- සමර්පණයකදී සජීවනය ඵලදායී අන්දමින් යොදා ගැනීම
- සමර්පණයකදී බහුමාධ්‍ය අන්තර්ගත ඵලදායී අන්දමින් යොදා ගැනීම
- ඵලදායී කදා පිරිසැලසුම, පසුබිම, සහ සංක්‍රාන්තිය භාවිතය
- විවිධ අන්දමින් සුරැකීම හා මුද්‍රණය කෙරෙහි අවධානය යොමු කිරීම

පාඩම් සැලසුම් සඳහා උපදෙස් :

- සමර්පණ මෘදුකාංගයක් ඇසුරින් සාර්ථක ඉදිරිපත් කිරීමක් සකස් කරන ආකාරය ප්‍රදර්ශනය කිරීම හා සාකච්ඡා කිරීම
- දෙන ලද මාතෘකාවකට අදාළ ව නිශ්චිත කදා සංඛ්‍යාවක් අඩංගු වන පරිදි සමර්පණ සැකිල්ලක් සැලසුම් කිරීමට උපදෙස් දීම(සිසුන් යුගල වශයෙන්)
- ඔවුනට අවශ්‍ය පරිදි කදා පිරිසැලසුම, තේමාව, සහ බහුමාධ්‍ය අන්තර්ගතය තෝරා ගැනීම
- සමර්පණ සැකිල්ල, සමර්පණ මෘදුකාංගයක් යොදි ගනිමින් සමර්පණයක් බවට පරිවර්තනය කිරීම
- මෙම සමර්පණය විවිධ ආකාර වලින් සුරැකීමට උපදෙස් දීම (Editable, Video, PDF, Show etc.)
- සමර්පණය අවශ්‍ය පරිදි මුද්‍රණය කිරීමට මෙහෙයවීම

ගුණාත්මක යෙදවුම් :

- සමර්පණ මෘදුකාංගයක් ස්ථාපනය කරන ලද පරිගණක(බහුමාධ්‍ය පහසුකම් සහිතව), බහු මාධ්‍ය ප්‍රක්ෂේපනයක්, සාදන ලද සමර්පණ, මුද්‍රකයක් සහ කඩදාසි

ඇගයීම් හා තක්සේරුකරණය සඳහාඋපදෙස් :

- ගුරුවරයා විසින් ප්‍රදර්ශනය කරනු ලබන ඉදිරිපත් කිරීමක දක්නට ලැබෙන ගුණාත්මක ලක්ෂණ සහ එය වැඩිදියුණු කළහැකි අන්දම සිසුන් කණ්ඩායම් දෙකක් මඟින් හඳුනාගෙන ඉදිරිපත් කිරීමට ඉඩකඩ සලසා දීම
- සිසුන් 4 දෙනකු බැගින් කණ්ඩායම් කොට, එක් මාතෘකාවක් බැගින් ලබාදීම (සමර්පණයකට සුදුසු ක්‍රියාකාරකම් සියල්ල ම අඩංගු වන පරිදි)
- දෙන ලද මාතෘකාවට අදාළව සමර්පණයක් නිර්මාණය කරන ලෙස උපදෙස් දීම
- නිර්මාණය කරන ලද සමර්පණය ඉදිරිපත් කිරීමට ඉඩ ලබා දීම
- සමස්ත පන්තිය ම ආවරණය වන සේ සාකච්ඡා මෙහෙයවා එහි අදහස් අනුව එක් එක් සමර්පණය වැඩි දියුණු කිරීමට උපදෙස් ලබා දීම

AlevelApi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

කියවීම් ද්‍රව්‍ය

සමර්පණයක් යනු කණ්ඩායමක් අරමුණු කොට ගත්, කිසියම් මාතෘකාවක් පැහැදිලි කිරීම, කණ්ඩායමක් ඇමතීම හෝ දේශණයක් පැවැත්වීම වැනි විවිධ අන්දමේ අවස්ථා සඳහා යොදා ගත හැකි ඉදිරිපත් කිරීමකි

සාර්ථක ඉදිරිපත් කිරීමක ලක්ෂණ

- අවශ්‍ය තොරතුරු සන්නිවේදනය කිරීමේ හැකියාවක් තිබිය යුතු ය
- ඒ සඳහා ගැළපෙන රූප සටහන්, ශ්‍රව්‍ය/දෘශ්‍ය අංග, වගු ආදිය යොදා ගත යුතු ය
- ප්‍රේක්ෂක අවධානය නොනැසෙන පරිදි සකස් විය යුතු ය
- මාතෘකාව පිළිබඳ ව ප්‍රේක්ෂකයා තුළ යහපත් ධනාත්මක ආකල්ප ගොඩ නැඟීමට සමත් විය යුතු ය

සමර්පණ මෘදුකාංග සහ ඒවායේ පොදු ලක්ෂණ

- සමර්පණ මෘදුකාංග මඟින් සමර්පණයක් කදා දැක්මක් ආකාරයෙන් සකස් කිරීමට සහ සංස්කරණය කිරීමට හැකියාවක් ලබා දේ

උදා: **MS PowerPoint, Impress, Prezi, Apple Keynote**

- පාඨ, රූපසටහන්, ශ්‍රව්‍ය/දෘශ්‍ය බහුමාධ්‍ය, ආදී දෑ ඇතුළත් කිරීමට හැකිවිය යුතු ය
- සජීවන, සංක්‍රාන්ති ආදීය මඟින් සමර්පණය වැඩිදියුණු කළ හැකි ය

අදාළ මෘදුකාංගයක් භාවිතයෙන් සමර්පණයක් නිර්මාණය

- සංගෘහීත සංවර්ධන පරිසරය(IDE) හඳුනා ගැනීම
  - මෙනු පටිය, මෙවලම් පටි, චලන පටි(Scroll bars), කදා හෙවත් කාර්ය පෙදෙස, ආදිය
- කදානිර්මාණය
  - කදා පිරිසැලසුම

    කදාවකට ඇතුළත් වන සියලු දෑ මෙහි අඩංගු විය යුතු ය ඒ අනුව පිරිසැලසුම තෝරා ගත යුතු ය

  - කදා පසුබිම
    දී ඇති අච්චු (Templates) මඟින්පහසුවෙන්පසුබිමසකස්කරගතහැකි ය
  - පාඨ සහ වස්තු
    කදාවක ඇති අක්ෂර(පාඨ) සඳහා විවිධ අන්දමින් අනුරූපකරණ ඇතුළත් කළ හැකි ය. මෙයට අමතර ව වෙනත් අංග ද කදාවක් මතට ඇතුළත් කළ හැකි ය
  - සජීවබ සහ සංක්‍රාන්ති ඇතුළත් කිරීම
    පාඨ සහ වෙනත් අංග සඳහා විවිධ අන්දමේ චලන යෙදිය හැකි ය.
    මෙයින් අවශ්‍ය අංගය කැපී පෙනෙන අන්දමින් සැකසිය හැකි ය

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

කදා සංක්‍රාන්තිය මඟින් එක් කදාවකින් තවත් කදාවකට වෙනස් වන ආකාරය නිරූපණය වේ

- කදා සටහන් **(slide notes)**
  සම්ර්පණය ප්‍රදර්ශනය කරන අවස්ථාවේදී, දේශකයාට අවශ්‍ය විය හැකි සටහන් සාදා තබා ගත හැකි ය. මෙම සටහන් ප්‍රේක්ෂකයාගෙන් සඟවා තබා ගත හැකි ය
- දර්ශන ආකාර (Presentation Views)

Slide view, Normal view, Outline view, Slide Sorter view and Slide Show view.

- සම්ර්පණයක් සුරැකීම
  - සම්ර්පණයක් පහත ආකාරවලින් සුරැකිය හැකි ය

    In MS Powerpoint with ppt, pptx or ppsx extensions, In Open Document Presentation with odp extension etc.

    එමෙන් ම සම්ර්පණයක් වෙනත් ආකාරවලින් දසුරැකිය හැකි ය.

    JPEGs (.jpg), Portable Document Format files (.pdf), web pages (.html), සහ වීඩියෝ ආකාරයෙන්

- කදා මුද්‍රණය
  - විවිධ ආකාරයේ පිරිසැකසුම් ලෙස කදා මුද්‍රණය කර ගත හැකි ය.
    - කදා
    - සම්ර්පණ සටහන් සහිත කදා
    - කටු සටහන් (outline) ආකාරයෙන්
    - අත් පත්‍රිකා වශයෙන් - එක් පිටුවකට කදා එකක් හෝ වැඩි සංඛ්‍යාවක් ඇතුළත් වන ලෙස

AlevelApi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ්‍ය හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බෝහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

නිපුණතා මට්ටම 4.4 : දත්ත සමුදායක ඇති දත්ත කළමනාකරණය සඳහා දත්ත සමුදාය කළමනාකරණ පද්ධතියක් භාවිත කරයි

කාලච්ඡේද සංඛ්‍යාව : 06

ඉගෙනුම් ඵල :

- දත්ත සමුදාය සංක්ෂිප්ත ව පහදයි
- හස්තමය සහ ඉලෙක්ට්‍රොනික් දත්ත සමුදායයන් සසඳා වෙනස දක්වයි
- දත්ත සමුදාය කළමනාකරණ පද්ධති මෘදුකාංග නිර්වචනය කරයි
- දත්ත සමුදාය කළමනාකරණ පද්ධතියක අවශ්‍යතාව හඳුනාගනී
- සම්බන්ධක දත්ත සමුදාය කළමනාකරණ පද්ධතියක වස්තු **(Objects)** ලැයිස්තු ගත කරයි
- ක්ෂේත්‍ර භාවිත කොට වගුවක්, නිර්මාණය කරයි
- වගුවක්, නිර්මාණය කිරීමේ දී අදාළ දත්ත ප්‍රරූප තෝරා ගනී
- ප්‍රාථමික යතුර ක්ෂේත්‍රය සහ ආගන්තුක යතුර ක්ෂේත්‍රයේ වැදගත් කම කෙටියෙන් පැහැදිලි කරයි
- ප්‍රාථමික යතුර ක්ෂේත්‍රය සඳහා සුදුසු ම ක්ෂේත්‍රය තෝරා ගනී
- අවශ්‍ය පරිදි සුදුසු ක්ෂේත්‍ර ගුණාංග යොදා ගනී
- විමසුම් භාවිතයෙන්, ක්ෂේත්‍රවලින් අවශ්‍ය දත්ත පෙරා ගනී
- අවශ්‍යතාව පරිදි දත්ත පෙරා ගනී
- දත්ත අවශ්‍ය පරිදි තෝරා ගනියි
- පෝරම මායාකරු ආධාරයෙන් පෝරම නිර්මාණය කරයි
- වාර්තා මායාකරු ආධාරයෙන් පෝරම නිර්මාණය කරයි

විෂය අන්තර්ගතය :

- දත්ත සමුදාය හැඳින්වීම
- හස්තමය සහ ඉලෙක්ට්‍රොනික් දත්ත සමුදාය වර්ගයන් සැසැඳීම
- දත්ත සමුදාය කළමනාකරණ පද්ධති මෘදුකාංග හැඳින්වීම
- සම්බන්ධක දත්ත සමුදාය කළමනාකරණ පද්ධතියක වස්තු **(Objects)**
  - වගු **(Tables)**
  - විමසුම්**(Queries)**
  - ලේබල **(Labels)**
  - වාර්තා **(Reports)**
- ක්ෂේත්‍ර නාම
- ප්‍රාථමික යතුර (ක්ෂේත්‍රය)සහ ආගන්තුක යතුර (ක්ෂේත්‍රය)
- ක්ෂේත්‍ර දත්ත ප්‍රරූප
  - **Text** (පාඨ)
  - **Number** (ඉලක්කම්)
  - **Date/Time** (දිනය/වේලාව)
  - **Currency** (මුදල්)

AlevelApi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

- **Yes/No**
- ක්ෂේත්‍ර සහලක්ෂණ
  - ප්‍රමාණය
  - ආකෘතිය
- විමසුම් නිර්මාණය කිරීම
  - ක්ෂේත්‍ර පෙරා ගැනීම
  - සටහන්(**Record**) පෙරා ගැනීම
- සටහන් තේරීම
- පෝරම මායාකරු **(Form Wizard)**
- වාර්තා මායාකරු **(Report Wizard)**

මූලික වදන්/සංකල්ප :

- එදිනෙදා ජීවිතයේ භාවිත වන දත්ත සමුදායන් හඳුනා ගැනීම
- හස්තමය දත්ත සමුදායයන්හි අවාසි
- ස්වයංක්‍රීය දත්ත සමුදායේ අවශ්‍යතාව
- දත්ත සමුදාය කළමනාකරණ පද්ධතියක අවශ්‍යතාව
- දත්ත සමුදාය කළමනාකරණ පද්ධතියක වස්තූන් හඳුනා ගැනීම
- වගු සකස් කිරීමේ අවශ්‍යතාව
- ක්ෂේත්‍ර නාම සහ දත්ත ප්‍රරූප පිළිබඳ ව අවධානය
- ක්ෂේත්‍ර ලක්ෂණ කෙරෙහි අවධානය යොමු කිරීම
- ප්‍රාථමික සහ ආගන්තුක යතුරුවල අවශ්‍යතාව
- විමසුම් භාවිතයෙන් දෙන ලද නිර්ණායකයනට අනුව, අදාළ රෙකෝඩ උකහා ගැනීම
